# 2018/09/11 දින පැවති මහාසභා රැස්වීම් වාතර්ාව

2018/09/11 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. එච්.ජී. තරංග සුදශර්න මහතා | ගරු මන්ත්‍රී |
| 8. කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. එන්.ජී. ගයාන් මධුසංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. ධමර්සිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. වී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 27. පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

ආගම සිහිකිරීම හා රට ජාතිය වෙනුවෙන් දිවි පිදූ ආරක්ෂක අංශවල සියළුම රණවිරුවන්, ගම් සභා නියෝජිතයින්, ප්‍රාදේශීය සභා නියෝජිතයින්, ගරු සභාපතිතුමන්ලා ඇතුළුමිය ගිය ඥාතීන් සිහිපත් කරලීම උදෙසා විනාඩි 02 ක නිශ්ශබ්දතාවයක් පළ කිරීම.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සැප්තැම්බර් මාසයට අදාළ මහා සභා රැස්වීම පැවැත්වීමට නියමිත අද දිනයේ අපේ ගරු සභාපතිතුමා උඩුගම පැවැත්වෙන සාහිත්‍ය උත්සවයකට සහභාගී වෙන්න මෙතනින් බැහැරව ගොස් ඇති බැවින්, එතුමාගේ අනුමැතිය ඇතුව සභාවේ වැඩ කටයුතු කර ගෙන යාමට බලාපොරොත්තු වෙනවා. අපේ ගරු සභාපතිතුමා තව ස්වල්ප මොහොතකින් මෙම ස්ථානයට සම්බන්ධ වේවි. එතෙක් සභාවේ කටයුතු කර ගෙන යාම සඳහා ඔබ සියළු දෙනාගේ සහයෝගය මම බලාපොරොත්තු වෙනවා. මේ අවස්ථාවට සම්බන්ධ වුණු ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඉතා ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් ගරු උප සභාපතිතුමා පිළිගැනීමේ කතාව සිදු කරන ලදී.

## 03. පසුගිය වාතර්ාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම

ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් පසුගිය සභා වාතර්ාවේ වෙනත් කරුණු යටතේ තමා විසින් ප්‍රකාශයට පත්කල කරුණු කේ.කේ.අයි. නෙරංජලී මහත්මියගේ නමින් සඳහන් වී ඇති බවත් එය සංශෝධනය විය යුතු බව පෙන්වා දෙන ලදී.

ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය විසින්, මම යෝජනාවක් කළා ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතාගේත් , මගේත් පළමු යෝජනාව ලෙස කොම්පෝස්ට් අංගනය දියුණු කළා කියල නමුත් එහි වෙරංග මන්ත්‍රීතුමාගේ නම පමණක් සටහන් වී ඇති බැවින් එය මාගේ නමත් ඇතුලත් කර සංශෝධනය කරන ලෙස දැන්වීය.

ගරු මන්ත්‍රිනී නෙරංජලී මහත්මිය විසින් පෙන්වා දුන්නේ මම ප්‍රකාශ කල අදහස් වාතර්ාවේ නැති බවත්, බල්බ් හා ඉණිමග සම්බන්ධව කරන ලද ප්‍රකාශ සහ ලක්රුවන් මන්ත්‍රීතුමා ඉනිමග සාදා ඇති බව ප්‍රකාශ කිරීම වාතර්ාවේ නොමැති බැවින් එය සංශෝධනය විය යුතු බවයි .

## 04. 2018.08.17 දින පැවති මහ සභා වාතර්ාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාතර්ාව ස්ථිර කිරීම.

එම සංශෝධන වලට යටත්ව සභා වාතර්ාව සභාව පිළිගතයුතු සත්‍ය වාතර්ාවක් ලෙස **ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී එන්. වී. සමන් මහත්මා විසින් නිවැරදි කරන ලද සංශෝධිත වාතර්ාව ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

## 05. විශේෂ නිවේදන

**01. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කායර්ාලය විසින් එවන ලද ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සඳහා පළාත් පාලන ආයතනවල සහභාගීත්වය පිළිබද 2018.09.06 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

ගරු උපසභාපති තුමා දේශපාලන කණ්ඩායම්වල නායකයින් අමතා, තමන්ගෙ පක්ෂය වෙනුවෙන් මේ සඳහා සහභාගි කරවන නියෝජිතයාගේ නම හා දුරකතන අංකය ලේකම් තුමියට ලබා දෙන ලෙසත් ඉදිරියේදී සම්බන්ධීකරණ කමිටුව නියෝජනය කළ හැක්කේ එම නියෝජිතයාට පමණක් බවත් දැන්වීය.

**02. පළාත් පාලන දෙපාතර්මේන්තුව මගින් යොමු කරන ලද 2018.08.29 දිනැති ඉදිරි වෂර්ය සඳහා සංවධර්න යෝජනා ලබා ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**03. පළාත් පාලන දෙපාතර්මේන්තුව මගින් යොමු කරන ලද 2018.08.30 දිනැති පළාත් පාලන ආයතන සතු අරමුදල් යොදාගෙන සිදුකරනු ලබන සංවධර්න කටයුතු සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

මෙහිදී ගරු උප සභාපතිතුමා තම අදහස් දක්වමින්, ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා පසුගිය කාලයේ යම් යම් සංවධර්න කටයුතු සඳහා ඇස්තමේන්තු සකස් කිරීම් කළ බවත්, ඒවා අනුමැතියට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අනුමත වී ඇති බවත් ඒ සඳහා නීතිමය තත්වය සකස් වී ඇති බැවින් මන්ත්‍රීතුමන්ලාට ගරු සභාපතිතුමා සමග සාකච්ඡා කර අදාල සංවධර්න කටයුතු සිදු කරනු ඇතැයි බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදී.

**04. පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් යොමු කරන ලද පපාසකො/ගා/ක්‍රීඩා-2018 හා 2018.09.06 දිනැති පළාත් පාලන ආයතන ක්‍රීඩා උළෙල- 2018 ගාල්ල දිස්ත්‍රික්කය ලිපිය සභාගත කරන ලදී.**

**06. සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

**01. ඉසුරු දොඩංගොඩ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2018.08.19 දිනැති විහාරස්ථානයට ප්‍රවේශ වන මාගර්ය සකස් කර ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී**

**02. ප්‍රජාමූල සංවිධානය, මාමනදොළ විසින් 2018.09.03 දින යොමු කරන ලද නාගොඩ යටලමත්ත මාමානදොල වතු මාගර්ය සංවධර්නය කිරීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**03. ප්‍රාදේශීය ග්‍රාම සංවධර්න සමිතිය උඩුගම බටහිර විසින් 2018.09.10 දින යොමු කරන ලද (ළමා ක්‍රීඩාපිටිය සංවධර්නය - උඩුගම දකුණ- කමර්ාන්තය ඉවු කිරීම සඳහා කැමැත්ත පළ කරන ලද) ලිපිය සභාගත කරන ලදී.**

**04. ආයුවෙර්ද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කායර්ාලය, නාගොඩ ආයුවෙර්ද වෛද්‍ය නිලධාරීතුමිය( ප්‍රජා සෞඛ්‍ය) විසින් 2018.09.07 දින යොමු කරන ලද ලෝක ළමා දින වැඩසටහන සඳහා ප්‍රාදේශීය සභා උප කායර්ාල දේශන ශාලාව ලබා ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

මේ සම්බන්දව ගරු උපසභාපත් තුමා කියා සිටියේ ලෝක ළමා දිනය වෙනුවෙන් සිදු කරන වැඩසටහනක් සඳහා ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරය පැය එකහමාරකට නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලා ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසයි.මේ සඳහා ගරු සභාවේ ඒකමතික අනුමැතිය හිමි විය.

මේ අතරතුර ගරු සභාපතිතුමා මූලාසනයට පැමිණ මෙතෙක් සභාව මෙහෙයවා පවත්වා ගෙන යාම සම්බන්ධව ගරු උප සභාපතිතුමාට තම ස්තුතිය පුද කරන ලදී.

**05. මූලික රෝහල, උඩුගම වෛද්‍ය අධිකාරී විසින් 2018.09.11 දින යොමු කරන ලද දිනපතා ජල බවුසරයක් ලබා ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

මෙහිදී ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ රෝහලේ තිබෙන ජලය ප්‍රමාණවත් නොවන බැවින් හා හදිසි අවශ්‍යතාවයක් බැවින් බද්දේගමින් හෝ වතුර ගෙනවිත් මේ සඳහා ලබා දීම අපේ වගකීමක් වන බවත් අඩුම ගානේ සායන පැවැත්වෙන දිනවලදීවත් මෙසේ ජලය ලබා දිය යුතු බවත්ය.

මෙහිදී ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා ප්‍රකාශ කර සිටියේ උඩුගම දකුණ ජල යෝජනා ක්‍රමයට සකස් කරන ලද ළිඳේ විශාල ජල ධාරිතාවක් පවතින බවත්, දැනට එහි ජලය පරිභෝජනය කරන අතර අවශ්‍ය නම් එක වතාවක් පිරිසිදු කර නොමිලේම ජලය ලබා ගත හැකි බවයි.

ගරු උප සභාපතිතුමා තම අදහස් දක්වමින් කියා සිටියේ උඩුගම රෝහලේ මේ දිනවලදී ගොඩනැගිලි කඩා අලුතින් ඉදි කරන බැවින් ඒ සඳහා ජලය ලබා ගැනීමට ඉල්ලුම් කරන්නේද යන්න සොයා බැලිය යුතු බවයි.

මේ සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන් වන රංජිත් ජයවීර මහතා, වසන්ත කුමාරගේ මහතා, ලක්රුවන් මහතා, පියල් හිරිමුතුගොඩ මහතා තම අදහස් දැක් වූ අතර මූලික රෝහලට සායන පවත්වන දිනයන්ට පමණක් හෝ ජලය ලබාදීමට සභාවේ ඒකමතික එකඟතාවය හිමිවුන අතර මේ දිනවල ප්‍රජාවටත් ජලය අවශ්‍ය බැවින් ඒ පිළිබඳවත් සොයා බලා කටයුතු කිරීමට එකඟතාවය පලවිය.

## 07. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

**නැත.**

## 08. යථා පරිදි කල් දී ඇති යෝජනා

01. 2018 වර්ෂයේ පැවැත්වීමට නියමිත පළාත් පාලන ක්‍රීඩා උත්සවය සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ටී- ෂර්ට් ලබා දීමට හා කණ්ඩායම් තරග ඇතුළු අවසන් දින උත්සවය සඳහා යන මුළු වියදම වශයෙන් රු. 185,000.00 ක මුදලක් හා ක්‍රීඩා උත්සවයේ සංවිධාන කටයුතු වෙනුවෙන් සහකාර කොමසාරිස් කාර්යාලය වෙත යැවීමට රු. 60000.00 ක මුදලකුත් ඇතුලත්ව මුළු මුදල වශයෙන් රු. 245,000.00 ක් වැය වෙතැයි අපේක්ෂා කරන බැවින් එය සභා අරමුදලින් දැරීමට යෝජනා කරමි.
මෙහිදී ගරු උප සභාපතිතුමා පැහැදිලි කරමින් කියා සිටියේ මෙම ක්‍රීඩා උත්සවය සඳහා රු. 245,000.00 ක් වැය වන බවත් මීට පෙරත් මෙහි සිටින ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු මේ සඳහා සහභාගී වූ බවත්, මේ සඳහා මුදල් දීම සුදුසු බවත්ය

ගරු සභාපතිතුමා ක්‍රීඩා උත්සවය සම්බන්ධව අදහස් දක්වමින් කියා සිටියේ රු. 60000.00 ලබා දීම සම්බන්ධව ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ගේ කණ්ඩායම් රැස්වීමේදී සාකච්ඡා කර තීරණයක් ගත යුතු අතර මෙම යෝජනාව අනුමත කර ගත යුතු බවයි.

**ඒ අනුව ක්‍රීඩා උත්සවය සඳහා යන වියදම වන රු. 245,000.00 ක මුදල ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් යෝජනා කරන ලදුව ගරු උපසභාපති එම්. කේ. ගාමිණී සුසන්ත මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව සභා සම්මත විය.**

02. නාගොඩ, ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල **පවත්වා ගෙන යන ගොඩනැගිල්ල සඳහා රු. 4000.00 ක් වන බදු කුලීය සභා අරමුදලින් ගෙවීමට යෝජනා කරමි.**

**මෙහිදී ගරු** සභාපතිතුමා අදහස් දක්වමින්, කැකුළු පෙර පාසල පවත්වන්නේ පෞද්ගලික ස්ථානයක බවත්, ඒ නිසා මෙම මුදල් ගෙවිය යුතු බවත්, ලබන වසරේ සිට මේ සඳහා යම් කිසි පියවරක් අනුගමනය කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී.
මේ සම්බන්ධව අදහස් දක්වමින් කියා සිටියේ ගරු මන්ත්‍රී වසන්ත මහතා, ගරු මන්ත්‍රී අජිත් මහතා සහ ගරු මන්ත්‍රී රංජිත් මහතා සහ ගරු උප සභාපතිතුමා කියා සිටියේ මේ වසරේ ඉතිරි මාස කිහිපය මෙහෙම ගෙවීම් සිදු කර ලබන වසරේ සිට සභාව සතු ස්ථානයකට ගෙන ඒම හෝ සභා අරමුදලින් ගෙවීම් කටයුතු සිදු කිරීම සුදුසු බවයි.

**ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු උපසභාපති එම්. කේ. ගාමිණී සුසන්ත මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව සභා සම්මත විය.**

03. PF 7360 කැබ් රථය සේවා කිරීම සම්බන්ධව යුනයිටඩ් මෝටසර් ලංකා පීඑල්සී ආයතනය මගින් එවා ඇති රු. 20890.28 ක බිල්පත ගෙවීමට අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

**ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව සභා සම්මත විය.**

04. PF 7360 කැබ් රථයේ ඉදිරිපස බ්‍රේක් පෑඩ් අලුතින් යෙදීමට යුනයිටඩ් මෝටසර් ලංකා පීඑල්සී ආයතනය මගින් එවා ඇති රු. 22867.00 ක බිල්පත ගෙවීමට අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කරමි.

සභාපති තුමා විසින් මේ සම්බන්දව කියා සිටියේ කැබ් රථය සේවා කිරීමට හා ඉදිරිපස බ්‍රේක් ෆෑඩ් යොදා සකස් කළ යුතු බැවින් ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙසයි.

**ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව සභා සම්මත විය.**

**05.** අංක 091 5621209 දරණ කායර්ාලයේ භාවිතා කල 2010.12.16 – 2011.01.15 දක්වා රු. 9070.03 ක හිඟ ශේෂයක් ගෙවීමට ඇත. මෙම ශේෂය ණය හිමි ලේඛනයේද සටහන් වී ඇති බැවින් නිරවුල් කිරීම සම්බන්ධව ගැටළුවක් නොමැත. මේ සඳහා අනුමැතිය ලබා දෙන මෙන් යෝජනා කරමි.

මෙහිදී ගරු උප සභාපතිතුමා මේ පිළිබඳ පැහැදිලි කරමින් කියා සිටියේ ලංකාබෙල් ආයතනය මගින් මා හට දුරකථනයක් ලබා ගැනීමට ඇණවුම් කළ අතර එයට සම්බන්ධතාවය ලබා ගැනීමට නම් උඩුගම උප කායර්ාලයේ භාවිත කළ ලංකාබෙල් දුරකථනය සඳහා ගෙවීමට ඇති හිඟ බිල ගෙවිය යුතු බවයි. එබැවින් වෙනත් දුරකථන සමාගමක් හරහා දුරකථනයක් ගැනීමට කටයුතු කරමු යන්නයි.
නමුත් මේ බිල්පත ණය හිමි ලේඛනයේ සටහන් වී ඇති බැවින් එය අනිවායර්යෙන් ගෙවිය යුතු බවත් ඒ සඳහා සභාවේ අනුමැතිය අවශ්‍ය බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී,
**ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව සභා සම්මත විය.**

මේ සම්බන්ධව ගරු මන්ත්‍රී නිශාන්ත මහතා, ගරු මන්ත්‍රී රංජිත් මහතා, ගරු මන්ත්‍රී ලක්රුවන් මහතා, ගරු මන්ත්‍රී තරංග මහතා, ගරු මන්ත්‍රී විලේගේ මහතා, ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා, ගරු මන්ත්‍රිනී නෙලී මහත්මිය වැඩිදුරටත් අදහස් ප්‍රකාශ කරන ලදී.

**06. නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් මාපලගම උප කායර්ාලය අසළ තිබූ අඹ ගසේ අතු කැපීම වෙනුවෙන් උපතිස්ස ගනේවත්ත මහතාට රු. 5000.00 ක මුදල ගෙවීමට අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කරමි.**

මේ සම්බන්ධව ගරු මන්ත්‍රී රංජිත් මහතාගේ අදහස වූයේ ගසේ එක අත්තක් පමණක් කපා ඇති බැවින් එම ගෙවීම අසාධාරණ බවයි. ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතාද එම අදහස අනුමත කරන ලදී.
එහිදී ගරු මන්ත්‍රී ධම්සිරි ගනේවත්ත මහතා තම අදහස් දක්වමින්, එක් අත්තක් පමණක් නොව අතු කිහිපයක් කපා ඉවත් කල බවත්, ඒ අවට ඇති ගොඩනැගිලි හා (තැපැල් කන්තොරුව), විදුලි රැහැන්, දුරකථන රැහැන්වලට අනතුරක් සිදු නොවන පරිදි දැඩි වෙහෙසක් දරා එම කටයුත්ත සිදු කල බවත්ය. මෙහිදී ගරු මන්ත්‍රී අජිත් මහතා කියා සිටියේ ගස්වල අතු කැපීම සහ අතු බෑම පහසු කාර්යයක් නොවන බවත්. එය හැම කෙනෙකුටම කළ නොහැකි බවත්ය.

**ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව සභා සම්මත විය.**

**07. ගරු දකුණු පළාත් සභා මන්ත්‍රී සුමනසිරි ලියනගේ මැතිතුමාගේ මන්ත්‍රී ප්‍රතිපාදන - 2017 යටතේ ගංවතුර හා නාය යෑම්වලින් හානියට පත් නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාගර් අලුත්වැඩියා සඳහා ලැබුණු රු. 100,000.00 ක මුදල ස්කවේටර් යන්ත්‍රයක් යොදවා මාගර් සංවර්ධනය කිරීම වෙනුවෙන් ජී. ජී. ධම්මික සිරිමෙවන් දේශප්‍රිය මහතාට ගෙවීමට අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කරමි.**

මේ සඳහා රු. 1,11,300.00 ක් වියදම් වී ඇති බවත්, එතුමා අපට රුපියල් ලක්ෂයක මුදලක් එවා ඇති බැවින් අපට ඒ මුදල ගෙවීමේ හැකියාව පවතින බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.
මේ සම්බන්ධව ගරු මන්ත්‍රී තරංග මහතා ප්‍රකාශ කර සිටියේ ඉතිරි මුදල වන 11,300.00 එතුමාගේ පෞද්ගලික වියදමින් ගෙවීම් සිදු කිරීමට කැමැත්ත ප්‍රකාශ කල බවයි.

**ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු මන්ත්‍රී තරංග සුදශර්න මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව සභා සම්මත විය.**

**8.1 ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා**

01. 2019 සඳහා වූ අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය ගරු සභාවට ඉදිරිපත් කර යෝජනා කරමි.

**අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය නිවැරදි බවට ගරු උප සභාපතිතුමා විසින් යෝජනා කරනු ලදුව මන්ත්‍රී වී.වී. සහබන්දු මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

02. දිස්ත්‍රික් ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ඇතුළු ආයුර්වේද වෛද්‍ය නිලධාරිනී විසින් අප ආයතනයේ ගරු මන්ත්‍රීවරුන්ට හා කාර්ය මණ්ඩලයේ සියළු දෙනාට ආයුර්වේද වෛද්‍ය සායනයක් පැවැත්වීමට කැමැත්ත ප්‍රකාශ කර ඇත. ඒ සඳහා ඉදිරි මහා සභා රැස්වීම පවත්වන දිනකදී එම ආයුර්වේද සායනය පැවැත්වීමට යෝජනා කරමි.

ඉදිරි සභාව පවතින දිනයට වෛද්‍ය සායනය පැවැත්වීමට කටයුතු කරන බවත්, එදිනට සියළු දෙනා සම්බන්ධ වන බැවින් එක් එක් අයට පරීක්ෂණ කටයුතු සිදු කර ගත හැකි බවත් දැනුම් දෙන ලදී.

**ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

03. උඩුගම බහුකායර් ගොඩනැගිල්ල විවිධ ප්‍රසංග සඳහා ඉල්ලීම් කරන බැවිනුත් එමගින් සභාවට ආදායමක් උත්පාදනය වන බැවිනුත්, එහි වේදිකාව සඳහා තිර රෙදි සකස් කිරීමට යෝජනා කරමි.

මේ සම්බන්දව ගරු සභාපතිතුමා කියා සිටියේ සභා අරමුදලින් වියදම් කර අඩු පාඩු සකස් කිරීම සුදුසු බවයි.මීට පෙරත් මෙම ගොඩනැගිල්ලේ විදුලිය සහ ජලය අඩු පාඩු සකස් කළ බවත් කියා සිටියේය.

**ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

04. සභා වාතර්ා පිළියෙල කිරීම සහ මහා සභා රැස්වීමේ අනෙකුත් ලේඛන කටයුතු ඡායා පිටපත් කිරීම සඳහා සභාවේ ඇති යන්ත්‍රයට විශාල පිරිවැයක් දැරීමට සිදුවන බැවින් පිටතින් ඡායා පිටපත් කිරීම වඩා ලාබදායී බව පෙනී යන හෙයින් ඩුප්ලෝ යන්ත්‍රයක් ලබා ගන්නා තෙක් පිටතින් සභා කටයුතු සඳහා ඡායා පිටපත් ලබා ගැනීමට යෝජනා කරමි.

මෙහිදී ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා කියා සිටියේ සභා වාතර්ාව දීඝර් වැඩි බවත්, එය සංක්‍ෂිප්ත කරන ලෙසත්ය.

මෙහිදී ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් කියා සිටියේ සභා වාතර්ාව සංක්‍ෂිප්ත විය යුතු තැන් තිබෙන අතර මන්ත්‍රීවරුන්ගේ අදහස් ප්‍රකාශ කිරීම් සංක්‍ෂිප්ත කිරීමේදී වඩාත් සැළකිලිමත් විය යුතු බවයි.එමෙන්ම මේ වියදම වාතර්ාවට පමණක් නොව සභාවේ සියළු ලිපි ලේඛන කටයුතු වලට යන වියදම ලෙස සඳහන් විය යුතු බවයි.

මේ සම්බන්ධව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා සහ ගරු මන්ත්‍රී තරංග මහතාද තම අදහස් ප්‍රකාශ කරන ලදී.

**මෙහිදී මේ වියදම් සාධාරනදැයි ගැන සළකා බලා ඩුප්ලෝ මැෂින් එකක් ලබා ගන්නා තෙක් පිටතින් ඡායා පිටපත් ලබා ගැනීමට තීරණය විය.**

**ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

**05. සම්බන්ධීකරණ නිලධාරියෙක් සහ ආදේශක රියදුරෙක් ලබා ගැනීමට යෝජනා කරමි.**

**ගරු සභාපතිතුමා විසන් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

- **8.2 කර්මාන්ත යෝජනා**

**8.3. ගරු සභාපතිතුමන් හා මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා**

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා ඉදිරිපත් කරන ලද යෝජනාවක් සංශෝධනය කිරීම**

I. 218 ගමගොඩ ප්‍රජා ශාලාවක් සඳහා කාබිල්වත්තේ ඉඩම බැකෝ යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීමට කරන ලද යෝජනාව එම ඉඩමේ ගැටලු කාරී තත්වයක් හේතුවෙන් එම යෝජනාව 218 ඩී ග්‍රාම නිලධාරී වසමේ උඩුගම උප මහජන ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීම යනුවෙන් සංශෝධනය කර ඉදිරිපත් කරමි.

**ඉහත සදහන් යෝජනාව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

මෙහිදී ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා ප්‍රකාශ කලේ අදහස් දැක්වීමකින් තොරව යෝජනාව ස්ථිර කල නොහැකි බවයි. මෙහිදී ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා ප්‍රකාශ කලේ යෝජනා ස්ථිර කර තබා ගන්නා ලෙසත්, එය ගැටළුවක් නොවන බවත්ය. ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතාද අදහස් දැක්වූ අතර ගරු සභාපති තුමන් කියා සිටියේ යෝජනාව ස්ථිර වූ බැවින් ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතාට අවශ්‍ය නම් අදහස් ඉදිරිපත් කළ හැකි බවයි.

**9. කාරක සභා වාර්තා**

**9.1. මුදල් ගෙවීම් වාර්තාව සම්මත කිරීම**

**<u>2018.09.11 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කල යුතු ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් පිළිබඳ වාර්තාව.</u>**

**01. මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම**

**2018 ජූලි මස විදුලි බිල්පත් පියවීම**

| | | | |
|---|---|---|---|
| I. | 4501090200 | - මාපලගම වෙළඳ සංකීර්ණ කොරිඩෝව | - රු. 2143.20 |
| II. | 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 532.80 |
| III. | 2810236100 | - මාපලගම ක්‍රීඩාංගණය | - රු. 240.00 |

**2018 අගෝස්තු මස**

| | | | |
|---|---|---|---|
| IV. | 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 606.00 |
| V. | 2810236100 | - මාපලගම ක්‍රීඩාංගණය | - රු. 240.00 |
| VI. | 4501090200 | - මාපලගම වෙළඳ සංකීර්ණ කොරිඩෝව | - රු. 2436.00 |
| VII. | 2809093105 | - කොමපෝස්ට් ව්‍යාපෘතිය | - රු 1704.00 |

**02. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය**

i. ජල බිල්පත් ගෙවීම- හෝමදොල ක්‍රීඩාංගණයේ හිග ජල බිල්පත ගෙවීම - රු. 2186.50
33/53/001/069/11-

03. ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව
සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම - රු. 2926.00

ආවරණ අනුමැතිය යටතේ කරන ගෙවීම් සඳහා ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**2018.09.11 දින පවත්වනු ලබන මහසභා රැස්වීම් සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.**

**01. 2018 අගෝස්තු මස විදුලි බිල්පත්**

| | | | |
|---|---|---|---|
| VIII. | 2813038709 | - කැකුලු පෙර පාසල | - රු.240.00 |
| IX. | 4507357802 | - සමනල පෙර පාසල | - රු.331.50 |
| X. | 4591713210 | - ප්‍රධාන කාර්යාලය | -රු.5052.90 |
| XI. | 8617046104 | - බහුකාර්ය මධ්‍යස්ථානය | - රු.551.10 |
| XII. | 2813189405 | - තල්ගස්වල පෙර පාසල | - රු.313.20 |
| XIII. | 8616374000 | - ටොයිලට් කම්ප්ලෙක්ස් උඩුගම | - රු..240.00 |
| XIV. | 8616373802 | - උඩුගම පොළ | - රු..240.00 |
| XV. | 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු.825.60 |
| XVI. | 2810125104 | - දීප්ති පෙර පාසල | - රු.258.30 |
| XVII. | 8617046104 | - බහුකාර්ය මධ්‍යස්ථානය | - රු.551.10 |

**2018 ජූලි මස විදුලි බිල්පත්**

| | | | |
|---|---|---|---|
| I. | 4592323912 | - යමුනා ස්ටෝර්ස් | -රු.240.00 |

**2018 ජූලි මස දුරකථන බිල්පත්**

| | | | |
|---|---|---|---|
| I. | 091-2231201 | - සභාපතිතුමාගේ නිවස | - රු.3304.15 |

**2018 අගෝස්තු මස දුරකථන බිල්පත්**

| | | | |
|---|---|---|---|
| I. | 091-2296537 | - ප්‍රධාන කාර්යාලය | -රු 4862.72 |

**02. ලේකම් , නාගොඩ ප්‍රාදේශීය සභාව**

I. 2018.08.27 දින පැවති පරිසර තාක්ෂණ ඇගයීම් කමිටුව සඳහා සහභාගී වූ කමිටු සාමාජිකයින් 9 දෙනෙකු සඳහා ගෙවීම් මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් 04
මධ්‍යම පරිසර අධිකාරි නිලධාරීන් 01
ලේකම්
තාක්ෂණ නිලධාරී
පරිසර විෂය භාර නිලධාරී
අඩෙවි වන නිලධාරී - රු. 4500.00

**03. 2018 ජූලි පුහුණු පාඨමාලාවන්ට සහභාගී වීම.**

| | | | |
|---|---|---|---|
| I. | ඩබ්.ඩබ්. පී. එම්. ප්‍රනාන්දු මිය | - ආයුර්වේද වෛද්‍ය | - රු.3550.00 |

**04. ආයතනයේ රාජකාරී ගමන් වල නියැලීම.**

| | | | |
|---|---|---|---|
| I. | බී. ඩී. එල්. ඩී. කුමාරි මිය | - පුස්තකාලයාධිපති | - රු. 350.00 |
| II. | ටී. සෙව්වන්දි මෙය | - පුස්තකාලයාධිපති | - රු. 350.00 |
| III. | වයි. ජී. ගංගා පද්මිනී මෙය | - පුස්තකාල සහායක | - රු. 350.00 |
| IV. | එන්. ජී. ගීතා රංජනී මිය | - පුස්තකාල සහායක | - රු. 350.00 |
| V. | එස් කේ මල්ලව ආරච්චි | - කළමනාකරණ සහකාර | - රු.1797.00 |

**05. <u>2018 අගෝස්තු පුහුණු පාඨමාලාවන්ට සහභාගී වීම.</u>**

| | | | |
|---|---|---|---|
| I. | කේ.පී. මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | - රු. 1722.00 |
| II. | එච්. එම්. හේවාවිතාන මෙය | - කළමනාකරණ සහකාර | - රු. 3320.00 |
| III. | ශ්‍රියානි කිරින්දගේ මිය | - පුස්තකාලයාධිපති | - රු. 542.00 |
| IV. | ටී. සෙව්වන්දි මෙය | - පුස්තකාලයාධිපති | - රු. 524.00 |
| V. | ඩබ්. ජේ. ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | - රු. 2620.00 |
| VI. | ඩබ්.ඒ.චමරි මදුෂානි මිය | - කාර්යාල කාර්ය සහායක | - රු. 1048.00 |
| VII. | කේ.පී.පී.ප්‍රසන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1048.00 |
| VIII. | එච්. ඩබ්. එස්. මල්කාන්ති මිය | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1048.00 |
| IX. | කේ. පී. ජයනි මිය | - සංවර්ධන නිලධාරී | - රු. 874.00 |
| X. | කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1048.00 |
| XI. | එම්.එච්.ෆර්සියා ෆර්වින් | -ලේකම් | - රු. 3626.00 |

**<u>06. ආයතනයේ රාජකාරී ගමන් වල නියැලීම.</u>**

| | | | |
|---|---|---|---|
| i. | එම්. ඒ. වසන්ත මයා | - රියදුරු | - රු. 2975.00 |

**07. අතිකාල දීමනා ගෙවීම්**

**<u>2018 ජුනි</u>**

| | | | |
|---|---|---|---|
| I. | එන්. එම්. රජිත මයා | - ආදේශක මුරකරු | - රු. 5625.00 |

**<u>2018 ජුලි</u>**

| | | | |
|---|---|---|---|
| I. | එන්. එම්. රජිත මයා | - ආදේශක මුරකරු | - රු. 4500.00 |
| II. | ඩබ්. කේ. සම්පත් සංජීව මයා (මුර සේවය වෙනවෙන්) | - ආදේශක රියදුරු | - රු. 6093.75 |

**<u>2018 අගෝස්තු</u>**

| | | | |
|---|---|---|---|
| I. | එම්. ඒ. වසන්ත මයා | - රියදුරු | - රු. 7034.00 |

**<u>08. පරිවර්ථීත ගමන් වියදම් (ක්ෂත්‍ර නිලධාරීන් සඳහා) 2018 අගෝස්තු</u>**

1 ඩබ් ජේ ඒ ශානක මයා - ආදායම් පරීක්ෂක රු .3000.00
2 කේ ජී ජයනි මිය - සංවර්ධන නිලධාරී රු 3000.00
3 ආර් ඒ එල් රත්නායක මිය - සංවර්ධන නිලධාරී රු 2160.00
4 කේ ඒ එදිරිසිංහ මයා -තාක්ෂණසේවා නිලධාරී රු 4000.00
5 දිලිනි දිසානායක මිය -තාක්ෂණසේවා නිලධාරී රු 4000.00

**09. එච්. එල් කේ ශ්‍රීනිත් රුක්ෂාන් උඩුගම**

උඩුගම මහජන පුස්තකාලයට පුවත් පත් සැපයීම වෙනුවෙන් ගෙවීම
2018 අගෝස්තු - රු .4630.00

**10. යූ.කේ.ජයන්ත මයා , ම.සෞ.ප.**

i. නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම හා ඒම වෙනුවෙන් ගෙවීම් (2018.08.24) - රු. 350.00
ii. නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම හා ඒම වෙනුවෙන් ගෙවීම් (2018.09.07) - රු. 500.00

**11. එච්.එල්.එන්.පී. කුමාර මයා , ම.සෞ.ප.**

i. නඩු සඳහා උඩුගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම හා ඒම වෙනුවෙන් ගෙවීම් (2018.08.07) - රු. 224.00
ii. ආහාර පනතේ නඩු සඳහා උඩුගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම හා ඒම වෙනුවෙන් ගෙවීම් (2018.07.24) - රු. 224.00
iii. ආහාර පනතේ නඩු සඳහා උඩුගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම හා ඒම වෙනුවෙන් ගෙවීම් (2018.06.22) - රු. 224.00
iv. කලුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයට යාම වෙනුවෙන් ගෙවීම (2018.07.31) - රු. 400.00

**12. එච්.ඩබ්.පී. අමරනාත් මයා , ම.සෞ.ප.**

i. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම හා ඒම වෙනුවෙන් ගෙවීම්
(2018.08.10) - රු. 354.00
(2018.08.24) - රු. 504.00
(2018.08.31) - රු. 504.00

**13. ආර්.ඒ.රංජිත් මානෙල් ,සීගිරි හොටෙල් ,නාගොඩ**

2018.08.17 දින පැවති මාසික සභා රැස්වීමේ සංග්‍රහ වියදම් බිල්පත පියවීම
(ආහාර ලබා ගැනීම) -රු. 3600.00

**14. ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්,නාගොඩ.**

i. 2018.08.17 දින පැවති මාසික සභා රැස්වීමේ සංග්‍රහ වියදම් බිල්පත පියවීම (තේ සංග්‍රහයට අවශ්‍ය ද්‍රව්‍ය) -රු. 2388.20

**15. ඩබ්.සරත්චන්ද්‍ර, ගාල්ල**

ii. නව තනතුරු සඳහා සේවකයන් බඳවා ගැනීමේ ගැසට් නිවේදනය ඉංග්‍රීසි භාෂාවට පරිවර්ථනය කිරීමේ ගාස්තු ගෙවීම. - රු. 4185.00

**16. ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පී එල් සී.කොළඹ 02**

iii. ගාඳනාප්‍රාසඳආඳ04 ඳ05 එජ්2001බ ඡායා පිටපත් යන්ත්‍රයේ වාර්ෂික සේවා ගිවිසුම සඳහා මුදල් ගෙවීම.(2018.08.01- 2019.07.31) - රු. 15835.50

**17. එල්කාර්ඩෝ ට්‍රේඩින් පුද්.සමාගම,නාවල**

iv. ජප 7360 දරණ කැබ් රථයේ කැනපි එකෙහි ලොක් එක සෑදීමේ බිල්පත පියවීම.- රු.6325.00

**18. ජයන්ත ඉලේපෙරුම ආරච්චි**

අගෝස්තු මස සභා වාර්තාව පිටපත් මුද්‍රණය සඳහා මුදල් ගෙවීම - රු.2340.00

**19. ආසිරි ටයර් ට්‍රේඩර්ස්**

එල් එල් 7103 අංකය දරණ ටිපර් රථයේ රෝද 2 ගලවා මාරු කිරීමේ බිල්පත පියවීම - රු.400.00

**20. ලේකම් නාගොඩ ප්‍රාදේශීය සභාව**

සභාපතිතුමා උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මන්ඩලයට 2018 අගෝස්තු මස ඉන්දන දීමනා ගෙවීම - රු.81000.00

21. ඒ කේ නීලන්ති සංජීවනී, ග්‍රොෆ් ටෙල් කමියුනිකේෂන්

සභාපතිතුමා උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මන්ඩලයට 2018 අගෝස්තු මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම - රු.88500.00

22. **නිමල් වික්ටර් නාගොඩ විතාන (සභාපති නමට ප්‍රතිපූර්ණය කල යුතු මුදල්)**

රාජකාරී අවශ්‍යතාවය මත අධි වේගී මාර්ගයේ වාහනය ධාවනය කිරීම වෙනුවෙන් බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය - රු.1650.00

2018.08.18-2018.08.20 දින දක්වා ප්‍රධාන අමාත්‍යංශය මගින් සංවිධානය කල වැඩමුලුව සඳහා 2018.08.20 දින ජප 7360 කැබ් රථය සඳහා ඉන්දන ලබා ගැනීමේ බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය - රු.3000.00

**පොදු අරමුදල් කර්මාන්ත**

**23. එම් ඩබ් නාමල් ලක්රුවන්**

2018.07.24,25 යන දිනයන්හි බැකෝ යන්ත්‍රය උඩුගම ඇප්ටොප්වත්ත පාර කැපීම හා කුණු වල කැපීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු.43500.00

**රජයේ ආධාර**

24. උඩුගම නැගෙනහිර ප්‍රජා ශාලාවට අමුද්‍රව්‍ය ලබාදීම සඳහා ලැබුණු මුදල පොදු අරමුදල් ගිණුමට බැර කිරීම (2012 මන්ත්‍රී ප්‍රතිපාදන) - රු. 10000.00

25. තල්ගස්වල ඇගළුම් කම්හල අසළ සිට තල්ගස්වල වත්ත තේ කම්හල දක්වා මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා ගෙවිය යුතු රැඳවුම් මුදල පොදු අරමුදල් ගිණුමට බැර කිරීම (2012 සංවර්ධන සැළැස්ම) - රු. 44961.48

26. ගෝණදෙනිය කළුඑලිගොඩ පාර 2ඩ4 බෝක්කු ලබා ගැනීම සඳහා ලැබී ඇති මුදල පොදු අරමුදල් ගිණුම සඳහා බැර කිරීම - රු. 10000.00

27. ගම්මැද්දේගොඩ මිල්ලගහවත්ත පාරට අවශ්‍ය බෝක්කු යොදා බැමි බැඳීම කර්මාන්තය වෙනුවෙන් ලැබුණු මුදල පොදු අරමුදල් ගිණුම සඳහා බැර කිරීම (2012 මන්ත්‍රී ප්‍රතිපාදන) - රු.50000.00

28. උඩවැලිවිටිය ශ්‍රී සම්බුද්ධ ජයන්ති විහාරයේ බෝධී මළුව ප්‍රතිෂ්ඨාපනය කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල පොදු අරමුදල් ගිණුම සඳහා බැර කිරීම - රු. 3000.00

<u>සේවක ණය</u>

29. ආපදා ණය ගෙවීම
ඩබ් ජේ අයේෂ් ශානක -රු.215320.00

**ඉදිරි ගෙවීම් වාතර්ාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**9.2. මුදල් කමිටු වාර්තාව සම්මත කිරීම**

<u>9.3 ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම</u>

| ඇස්තමේන්තුව | මුදල රු. |
|---|---|
| **පොදු අරමුදල් ඇස්තමේන්තු** | |
| උඩුගම 218 C මොරගල්මුල්ල, කාබිල්වත්ත මාගර්ය සංවධර්නය කිරීම | 37500.00 |
| අකුලහේන පොදු ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම | 140,000.00 |
| උඩුගම උප මහජන ක්‍රීඩාංගණය JCB යන්ත්‍රයක් යොදා සංවධර්නය කිරීම | 15,000.00 |
| AR 5316 ෆොටෝ කොපි යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | 8914.80 |

**ඉහත ඇස්තමේන්තු ගරු උප සභාපතිතුමා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී එන්.වී. සමන් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු සභාපතිතුමා ගරු සභාව අමතමින්, අපි ගිය සභා වාරේ J.C.B. යන්ත්‍රය වෙන්දේසි කිරීමට අදාළ පරීක්ෂණ කමිටුවක් පත් කල බවත්, එම කමිටුව පසුගිය 07 වනදා කැඳවීම් කල නමුත් කමිටු සාමාජිකයින් කිහිප දෙනෙකුට පෞද්ගලික හේතූන් මත සහභාගි විය නොහැකි බව දූරකථනයෙන් හා ලිඛිතව දැණුම් දීම් කල නිසා එදිනට පරීක්‍ෂණ කටයුතු සිදු නොවූ අතර, එහෙත් මෙය කල්දැමීම සුදුසු නොවන බැවින් හැකි ඉක්මණින් මේ සම්බන්ධ වාතර්ාවක් ලබා දෙන ලෙස දන්වන ලදී. එමෙන්ම දැනටමත් 12 – 14 දෙනෙක් මේ වෙන්දේසිය සඳහා මුදල් ගෙවා ඇති බැවින් මෙය ඉතා ඉක්මණින් පැවැත්විය යුතු නිසා මේ ගැටළුව ඉතා ඉක්මණින් විසඳා ගැනීමට කටයුතු කරන ලෙස සභාවට දන්වන ලදී.**

ඒ සම්බන්ධව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා කියා සිටියේ, මොනව හරි ප්‍රශ්ණයක් තියෙනවනම් ඒක කොහොම හරි විසඳගත යුතු බවත්, මේ සභාවම කාරක සභාවක් හැටියට පත් කර මේ ගැටළුව විසඳාගැනීමට කටයුතු කරන ලෙස යෝජනා කරන බවයි.

ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා මේ සම්බන්ධව තම අදහස් ප්‍රකාශ කරමින්, මේ සම්බන්ධව කමිටුවක් පත් කල බවත්, කමිටුව රැස්වී තීන්දුවක් ගැනීම සුදුසු බවත්, කොමසාරිස්වරයාගෙන් මේ සම්බන්ධව පරීක්ෂණයක් ඉල්ලා ඇති බැවින් හා අදාළ යන්ත්‍රය පරීක්ෂාවකින් තොරව තීන්දුවක් ගැනීමේ හැකියාව නොමැති බවත් දන්වන ලදී. එමෙන්ම දැන් කාරක සභාවක් හැටියට පත්වෙනවනම් මම කාරක සභාවෙන් ඉවත් වන බවත්, මේ J.C.B. යන්ත්‍රය අද තියෙන තත්වය සහ මේ සම්බන්ධයෙන් ලැබිලා තියෙන පැමිණිලි දෙස බැලුවම මේ වගේ පොඩි වෙලාවකින් එය සිදු කල නොහැකි බවත් දන්වන ලදී.

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් කියා සිටියේ ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා ගෙන ආ යෝජනාවට එකඟතාවය පළ කරන බවත්, ගරු ලේකම්තුමිය, විෂය භාර නිලධාරීන්, කාමරීක නිලධාරීන් මේ සම්බන්ධව දැනට තියෙන ලිපිලේඛන, විගණන වලට අදාල ලේඛන, කොමසාරිස්තුමා මේ සම්බන්ධව යොමු කර ඇති ලිපි ලේඛන සභාවට ඉදිරිපත් කර මේ ගරු සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කරන ලෙස යෝජනා කරන බවයි. එමෙන්ම , මෙහිදී ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතාගේ මූලිකත්වය බලාපොරොත්තු වන අතර, එතුමා ඉල්ලීමක් කරනවානම් සභාව පැයකට කල් තබා එම ස්ථානයට ගොස් J.C.B. යන්ත්‍රය පරීක්ෂා කිරීමට කමිටු සාමාජිකයෙක් වශයෙන් එකඟතාවය පළ කරන බවත්, J.C.B. යන්ත්‍රය වෙන්දේසි කරනු ලබන්නේ අපේ අවශ්‍යතාවයක් මත නොවන අතර මෙහි මූලික කටයුතු අපි සභාවට පැමිණීමට පෙර සිදු වී තිබූ බැවින් එම ක්‍රියාපටිපාටිය ඉදිරියට ගෙන යාමක් පමණක් සිදු කරන බව ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් විමසා කටයුතු කිරීම වඩාත් යෝග්‍ය බවද වැඩිදුරටත් දන්වා සිටින ලදී.

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා නැවතත් අදහස් දක්වමින්, කොමසාරිස්තුමා මෙය නතර කරන්න කිව්වෙ එයාලගෙ පරීක්ෂණ කණ්ඩායමක් එනවද? සභාවෙන් ඒ සම්බන්ධ වාතර්ාවක් ඉල්ලනවාද? එසේ වාතර්ාවක් ඉල්ලනවානම් එවැනි වාතර්ාවක් දෙන්න අපිට තාක්ෂණික දැනුමක් නොමැති බව ප්‍රකාශ කළේය.

### 9.4 මිළ ගණන් ඉදිරිපත් කිරීම

### 10. ලැබීම් හා ගෙවීම් වාර්තා

ලැබීම් හා ගෙවීම් වාතර්ා ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදී.

## 11.වෙනත් කරුණු :-

### ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය

ගරු සභාපති තුමා ඇතුලු ගරු සභාවෙන් අවසරයි. වෙන සභාවන් දිහා බැලුවම අපේ සභාව ගොඩක් හොඳයි කියලා කියන්න පුලුවන්. මොකද වෙන සභාවන්වල වගේ නෙවෙයි අපේ සභාවෙ පක්ෂ හතරක සභිකයන් හිටියත් ගැටළු ඇති කර ගන්නේ නැතිව අවුල් සහගත තත්වයක් නැතිව විනෝදයෙන් යුතුව සභාව ගෙන යාම පිළිබඳව අපේ සියළුම මන්ත්‍රීවරුන්ට හා මන්ත්‍රීවරියන්ට මම ස්තූතිවන්ත වෙනවා. ඒවගේම වෛද්‍ය සායනයකට සහභාගි වීම සඳහා යාමට ඇති බැවින් සභාවෙන් බැහැර වීමට අවසර ඉල්ලා සිටිනවා . ස්තූතියි.

### ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා

ගරු සභාපතිතුමනි අවසරයි වෙනත් කරුණු යටතේ මම ප්‍රථමයෙන්ම පුංචි අදහසක් ඉදිරිපත් කරන්න කැමතියි මීට පෙර සභා වාරවලදී බොහෝවිට කරුණු ඉදිරිපත් කළා ඒ පිළිබඳවත් ගැටළු තියෙනවා මම මේ අවස්ථාවේ නැගී සිටියේ පුංචි ප්‍රසාදයක් පළකිරීම සඳහා ඔබතුමාටත් මතක ඇති පසුගිය සභාවාරයක මම උඩුගම බංගම මාගර්යේ බෝක්කුවක් පිළිබඳව කරුණු කාරණා සඳහන් කර ජනතාව වෙනුවෙන් ලොකු ඉල්ලීමක් කළා ඒ වගේම මම ප්‍රාදේශීය ලේකම් කායර්ාලයේ පැවැති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවෙත් ඒ යෝජනාව ඉදිරිපත් කළා ඒ යෝජනාව මල්ඵල ගැන්වීමක් සිදු වෙලා තියෙනවා මේක දවසක දෙකක ප්‍රශ්නයක් නොවෙයි වසර 15කට 20කට විතර උඩ ඉඳල මේ ඉල්ලීම කරනව අපේ පාලන සමය වෙලත් මේ පිළිබඳ අපි දැඩි ලෙස ඉල්ලීම් කළා ඉන්පසු එක්සත් ජාතික පක්ෂ පාලන යුගයකුත් පැවතුණා නමුත් එවිටත් මේ කාරණය ඉෂ්ට කරගන්න බැරි වුණා ඒ හැම අවස්ථාවකම අපට ලැබුනෙ ඊළඟ ඡන්දෙන් පස්සෙ පාලමක් දාලා පාර කෙලින් කරලා මාගර්ය සකස් කරල දෙන්නම් කියන තීන්දුව පහුගිය කාලේ වාහනයක් තියා බයිසිකලයක්වත් යන්න බැරි තරමට පාර පත්වෙලා තිබුණා ඉන්පසු මගේ ඒ යෝජනාවක්‍රියාත්මක වෙලා ඊට පස්සෙ මම අවශ්‍ය නිලධාරීන් සමග සාකච්ඡා කළා බොහෝ වෙලාවට 99% ක්ම රජයේ ආයතනවල පවතින තත්වයන් ජනතාව පිළිබඳ දක්වන ආකල්ප,ජනතාවගෙ ආකල්ප එතරම් සුබදායක නැහැ එවැනි යුගයක මෙම කායර්යන් ඉෂ්ට කර ගැනීම සඳහා රජයේ නිලධාරීන් අපට ලොකු සහයෝගයක් දැක්වුව ඒ අනුව දකුණු පළාත් මාගර් සංවධර්න අධිකාරියේ සාමාන්‍යාධිකාරි තුමා උපාලි ලියනගේ මැතිතුමා හික්කඩුව ප්‍රාදේශීය කායර්ාලයේ දිස්ත්‍රික් නිලධාරී තුමා සමග මම සාකච්ඡා කළා මම හිතන්නේ දිස්ත්‍රික් ඉංජිනේරු තුමාගේ ඉල්ලීම පරිදි ඒ ස්ථානයේ ස්ථානීය නිරීක්ෂණයක් සිදු කළා එහිදී එතුමන්ට අවබෝධ වුණා මෙම මාගර්යේ තත්වය මගේ කොට්ඨාශයේ මායිම අම්බලම් පිටි දොල මගේ ප්‍රදේශයේ ජනතාවට විතරක් නෙවෙයි ම හිතන්නේ කතරගම ප්‍රදේශයේ වන්දනාමාන කරන විශාල පිරිසක් මාතර නගරය දක්වා ගමන් කරන කෙටිම මාගර්ය හැටියට සලකන්නේ මේ මාගර්ය මේ පිළිබඳ අවදානය යොමු කරල සති දෙකක කාලයක් යන කොට සියලු ලිපිලේඛන සකස් කර ටෙන්ඩර් කර අවශ්‍ය ක්‍රියාපටිපාටිය අරගෙන ඒ කායර්ය සිදු කළා ඒ වගේම මම ටෙන්ඩරය ගනිපු මහතා සමඟ පෞද්ගලිකවම කතා කරලා ඉතා ඉක්මනින් ඊයේ දවසේ සුභ මොහොතින් ඒ කටයුත්ත ආරම්භ කළා ඒ නිසා මම මේ වෙලාවේ විශේෂයෙන් දකුණු පළාත් මාගර් සංවධර්න අධිකාරියේ සාමාන්‍යාධිකාරී තුමාට ඒවගේම දිස්ත්‍රික් ඉංජිනේරු අරුණ ගුණවධර්න මැතිතුමාට ඒ වගේම මේ සඳහා සහයෝගය දීපු සියලුම නිලධාරීන්ට තවලම ප්‍රාදේශීය ඉංජිනේරුතුමන් වන ඩයස් මැතිතුමා ඇතුළු සහයෝගය දීපු සියලුම රජයේ නිලධාරීන්ට ජනතාව වෙනුවෙන් විශේෂයෙන් ප්‍රසාදය පලකරනවා ඒ නිලධාරීන් කායර්ක්ෂම විදිහට මැදිහත්වෙලා ජනතාවගෙ ගැටලුව නිරාකරණය කර දීම පිළිබඳව මම විශේෂයෙන් නැවත නැවතත් රජයේ නිලධාරීන් සියලු දෙනාට මාගේ කෘතවේදීත්වය සහ ප්‍රණාමය පළ කරන්න මම මෙක අවස්ථාවක් කර ගන්නවා ඒ වගේම ගරු සභාපතිතුමනි ඔබතුමාත් මේ කායර්යට ඉතා ක්‍ෂණිකව මැදිහත්වී අවශ්‍ය ලිපි ලේඛන සකස් කර දී මට ඒ කටයුත්තට සහයෝගය ලබාදීම පිළිබඳ ඔබතුමාටත් ස්තූතිවන්ත වෙනවා ඒ වගේම නිශාන්ත මුතුහෙට්ටිගම ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා මේ කටයුත්තට එතුමන්ගෙ නිදෙර්ශයක් අවශ්‍ය වුණා එහිදී එතුමන් දේශපාලන වශයෙන් අපට සහයෝගය දැක්වූවා ඒ වගේම ප්‍රාදේශීය ලේකම් කායර්ාලය දැක්වූ සහයොගයත් සිහිපත් කරමින් මට සහයෝගය ලබා දීපු සියලු දෙදෙනාටම නැවත වරක් මාගේ කෘතවේදීත්වය සහ ප්‍රණාමය පුදකරනවා ස්තූතියි

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමා ප්‍රධාන සියලු මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. ප්‍රථමයෙන්ම මගේ සංශෝධනය සහිත යෝජනාව සභාවට ඉදිරිපත් කරන්න සූදානම්. ඒ සම්බන්ධව අපේ හිටපු ගරු සභාපතිතුමා ඒ පිළිබඳව විග්‍රහයක් කරන්න අවශ්‍ය බව පැවසුව. මම ඒ යෝජනාව කළේ, උඩුගම 218 බටහිර කොටසෙ නිතර ගංවතුරට හසුවන ග්‍රාමසේවා කොට්ඨාසයක්,අපි තීරණය කළා ඔවුන්ට ප්‍රජා ශාලාවක් හදල දෙන්න. ඒ සඳහා අවශ්‍ය ගෙපල JCB යන්ත්‍රයක් යොදා සංවධර්නය කිරීමට අදහස් කළත් එම ඉඩම සම්බන්ධව නීත්‍යානුකූල ගැටලුවක් තිබුන නිසා එය පසුවට කල් දාල, 218 කොට්ඨාසයේ උඩුගම උප මහජන ක්‍රීඩාංගනය ක්‍රීඩාවට අවශ්‍ය පරිදි සංවධර්නය කරන්න මම තීරණය කළා.ඒ ක්‍රීඩා පිටිය මේ දවස්වල මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් ගේ ග්‍රහණයට ලක් වුනු, ඒ වගේම අනාචාරයේ හැසිරෙන ස්ථානයක් බවට පත් වෙලා. මේක අපට අයිති භූමියක් නිසා ප්‍රදේශයේ ක්‍රීඩා කෞෂලාශයය දියුණු කිරීම සඳහා ඒ වගේම ප්‍රදේශයේ ළමයින්ට ක්‍රීඩා කරන්න ස්ථානයක් නැති නිසාත්,මම මගේ යෝජනාව සංශෝධනය කර එම ක්‍රීඩා පිටිය අවශ්‍ය පරිදි සංවධර්නය කළ යුතු යැයි තීරණය කළා. ඔබ තුමාට පැහැදිලි වෙන්න ඇති කියල මම විශ්වාස කරනව.

ඒ වගේම ගරු සභාපතිතුමා මම මතක් කරන්න ඕන මගේ ගමට මායිම්ව තියෙන උඩුගම දාවුල්හේන ප්‍රධාන මාගර්යෙ කාපට් අතුරලා තියෙනවා. සමහර තැන්වල කැඩිලා තියෙනවා. ඒ නිසා දවුල් හේන සුභ සාධක සමිතියත්, වටවල වතු සමාගමත් සම්බන්ධ කරගෙන මහා ශ්‍රමදානයක් මගින් කිලෝ මීටර් තුනක පමණ ප්‍රමාණයක් ජනතාව 200 ක ගෙ පමණ සහභාගිත්වයෙන් ශුද්ධ කරල කොරිපස් දාල සභාවකට මාස දෙකකටවත් කරන්න බැරි ප්‍රමාණයේ වැඩ කොටසක් අපි කළා.ඒ සඳහා නාගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා හැටියට මේ කටයුත්තට සියලු සම්පත් උපයෝගී කර ගන්න මට අවස්තාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට මේ අවස්ථාවේ මගේ ස්තුතිය පුද කර සිටිනවා.

ඒ වගේම මම නිරන්තරව උඩුගම පොළ ගැන සඳහන් කළා. ඒ සිහිනය දැන් සැබෑ වෙමින් පවතිනවා. ඊයෙත් පොළ භූමිය සුද්ධ කරලා කණු හිටවමින් යනවා. ඒ නිසා උඩුගම පුරවරයට අපි බලාපොරොත්තු වුන වෙනස , ප්‍රජාවට අවශ්‍ය කරන පහසුකම් සැලසීමට නාගොඩ ප්‍රාදේශීය සභාවක් වශයෙන් යුතුකම් කොටස ඉටු කරන්න හැකි වේය කියන විශ්වාසය මා තුළ තියෙනවා. මගේ කොට්ඨාසය නියෝජනය කරන ගයන්ති කුමාරි මන්ත්‍රීතුමියටත් සතුටු ඇති. සියලු දෙනාගෙම කොට්ඨාස තුල සංවධර්නය වෙනව දකින්න සියලු දෙනාම කැමතියි.ඒ පිළිබඳව ඔබතුමා ක්‍රියාමාගර්යක් අරගෙන ඒ වැඩකටයුතු කරගෙන යෑම පිළිබඳ මාගේ ස්තුතිය පුද කරනවා.

එමෙන්ම උඩුගම ශ්‍රවණාගාරය තුළ පවතින අඩුපාඩු කටර්න් එක ,ඒ හැරුනාම ඕනෑම උත්සවයකදී, ශ්‍රවණාගාරයක් තුළ තිබිය යුතු ප්‍රධාන පහසුකම තමයි ජාතික කොඩිය එසවීම. මොකද අපි ජාතියක් වශයෙන් ජාතියට පණ දෙන්න ඕන මුලින්ම. ඒ නිසා කොඩි කණුවක් හිටව ගන්නවත් තැනක් නැහැ. මේ ශ්‍රවණාගාරය ඉතාම ඉහළින් අලෙවි වන ස්ථානයක් බවට පත්වෙලා තියෙනව. එතනට අවශ්‍ය පහසුකම් ඉතාම ඉක්මනින් පොදු අරමුදලින් හරි වියදම් දරලා සකස් කර දෙන ලෙස මම ඉල්ලා සිටිනවා. මොකද අවශ්‍ය කරන පහසුකම් නැතිව ශ්‍රවණාගාරයක් තුළ ඉදිරියට යන්න බැහැ.

ඒ වගේම මම උඩුගම කුරුන්ද මාගර්යේ ලයිට් කණුවක් සම්බන්ධව සඳහන් කළා. ඒ සම්බන්ධව ලේකම්තුමිය විසින් යවන ලද ලිපියට පිළිතුරු වශයෙන් අසූනව දහස් ගණනක ඇස්තමේන්තුවක් ලැබිල තියෙනවා.මේක අපි පිහිටවපු ලයිට් කණුවක් නෙවෙයි. අපට අයිති පාරක විදුලිබල මණ්ඩලයෙන් හිටවපු කණුවක්.ඒක ඉවත් කරල අපේ ජනතාවට පහසුවෙන් ගමන් කිරීමේ ක්‍රමවේදයක් හදලා දෙන එක විදුලිබල මණ්ඩලයේ වැඩක්.ඉතින් ඒ පිළිබඳ නැවත දැනුවත් කරල ලිපියක් යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම ඇප්තොප් වත්තේ පොල් ඉඩම සම්බන්ධව. දැන් අපි එක සැරයක් පොල් කැඩුවා. පොල් ඉඩම සංවධර්නය පිළිබඳව ඔබතුමා විධිමත් වැඩපිළිවෙලක් කළා ද කියන එක මම දන්නේ නැහැ. ඒ නිසා ඉදිරියේදී පෝර භාවිතා කරනවා නම් පෝර භාවිතා කරල අවශ්‍ය කරන එල නෙළා ගැනීමට අවශ්‍ය පියවර ඔබතුමා ගනීවි කියලා බලාපොරොත්තු වෙනවා. ඒ වගේම තමයි ඇප්තොප් වත්තෙ සංවධර්න කටයුත්තක් සිදු වෙලා තියනවා. අවශ්‍ය පහසුකම් සලසල තියෙනව. ඒ වෙනුවෙනුත් ඔබතුමාට මාගේ ස්තුතිය පුද කරනවා.

ඒ වගේම අපේ සභාව තුළ තියෙන සම්පත් වාහන යනාදී සියලු දේවල්වල ආරක්ෂාව නිසියාකාරව සිදු නොවන බව තමයි පෙනෙන්නෙ. මොකද මම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ජේෂ්ඨ ආරක්ෂක නිලධාරියෙක් වශයෙන් වසර 20 ක පලපුරුද්දක් තියෙන කෙනෙක්. අපට ආයතනයක් තුළ ආරක්ෂාවට යාම අත්සන් කරන්න තොරතුරු සටහන් පොතක් තියෙනවා. සියලු විස්තර සටහන් පොතේ සටහන් කළ යුතු වෙනවා. ඒ වගේම ඒ ආරක්ෂකයන්ට අවශ්‍ය කරන පහසුකම් ලබා දෙන්න ඕන. එහෙම පහසුකම් ලබාදීලත් නැහැ. අනිත් එක තමයි උප කායර්ාලයේ වාහන ගාල් කරාට පස්සේ ඒ පිළිබඳ වාතර්ාවක් ලබාගන්න ඕන. ඒක ආරක්ෂක නිලධාරියෙක් සතු වගකීමක් වෙනවා. එහිදී අදාළ වාහනයේ පැති කණ්නාඩි තියෙනවද, සිග්නල් ලයිට් තියනවද, ධාවන ටැංකියෙ මූඩිය තියෙනවද, එතකොට වෙනම යතුරු පුවරුවක් තියෙනව. ඒවගේ නිවැරදි ක්‍රම භාවිතා කරන්න කාලය එලඹීලාය කියල මම හිතන්නෙ. මගේ කතාව අවසන් කරනවා බොහොම ස්තූතියි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී විජිත් වීරගුණරත්න සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි මම කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ අපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල බහුකායර් සෞඛ්‍ය මධ්‍යස්ථානය තුනක් තියෙනවා. උඩුගම, යටලමත්ත, මාපලගම. යටලමත්ත මධ්‍යස්ථානයට අපද්‍රව්‍ය බහාලුම් ලබාදීලා නැහැ. ඒ බහලුම් ලබාදීමට අවශ්‍ය කටයුතු කරන්න කියල මම යෝජනා කරනවා. අනිත් මධ්‍යස්ථාන දෙකට අපද්‍රව්‍ය වෙන්කර දැමීම සඳහා වෙන වෙනම බහාලුම් ලබා දීල තියෙනව. යටලමත්ත මධ්‍යස්ථානයටත් අපද්‍රව්‍ය බහාලුම් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනව. ස්තූතියි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමනි මේ දිනවල පවතින දැඩි නියගය නිසා ජලය පිළිබඳ විශාල ප්‍රශ්න රැසකට මුහුණ දෙන්න සිදු වෙලා තියෙනවා. ඒවගේම කැප්පිටියාගොඩ ජනතාව වෙනුවෙනුත් ඒ ප්‍රශ්නයට මුහුණ දෙන්න තියෙනවා. මම කිහිප වතාවක්ම දැනුම් දුන්න ගඟට බහින්න තියෙන අපේ තොටුපළවල් කිහිපයෙන් එකක් වත් හදලා සුද්ද කරලා දෙන්න කියලා. මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මේ වතාවෙ වත් මේ පිළිබඳ සැලකිලිමත්වෙලා එක තොටුපොළක්වත් සකසා දෙන්න කියල.ඒ වගේම පසුගිය සභාවේ මම යෝජනාවක් ගෙනාවා. නාගොඩ පයර්න්ත රෝහලේ කුණුවලක් සකස් කිරීම සඳහා කම්කරුවන් ලබාදෙන ලෙස. නමුත් ඒ පිළිබඳව තවම කිසිම කටයුත්තක් කෙරිලා නැහැ. ඒ පිළිබඳ සැලකිල්ලක් දක්වලා ඒ කටයුතු නිසියාකාරව කරල දෙන්න කියල ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ස්තූතියි.

**ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී කේ කේ අයි.නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමා ගෙන්ද ලේකම්තුමිය ගෙන්ද සියලු මන්ත්‍රීවරුන් ගෙන් සහ මන්ත්‍රීවරියන් ගෙන් ද අවසරයි. මමත් මේ අවස්ථාවේ නැගී සිටියේ. මේ නියං සමයේ අපේ ප්‍රදේශයටත් වතුර හිඟ තත්වයක් පවතිනව.එබැවින් ගිං ගඟට බහින්න තොටුපොළවල් කීපයක් හදලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. අනික් කරුණ කැප්පිටිය ගොඩ පාලම ලඟ විදුලි පහන මේ අවස්ථාව වන විට නැති බව ජනතාව ප්‍රකාශ කරනවා. උදේ හතරට කොළඹ බස් එකට යන මගින් මේ ස්ථානයේ ඉන්නෙ ඔවුන් විශාල අපහසුතාවයකට පත්වෙනවා.එනිසා එම ස්ථානයේ විදුලි පහන සකස් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

අනික් කරුණ තමයි උඩවැලිවිටි තලාව පැත්තට යන මාගර්ය දැන් තැනින් තැන කැඩිලා තාර පාරේ තැනින් තැන වලවල් හැදිල. අලුත් පාලමෙන් එගොඩ වෙලා යන ප්‍රධාන පාර තැනින් තැන වලවල් හැදිලා තියෙනවා. වහින වෙලාවට වතුර පිරී ඇති බැවින් එම මාගර්යේ ගමන් කිරීම ඉතා පහසුයි. ප්‍රාදේශීය සභාවට අයිති පාරක්. ඒ නිසා තවත් විනාශ වීමට පෙර ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. සියලු දෙනාට ස්තූතියි

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි මට ප්‍රකාශකරන්න අදහස් කිහිපයක් තියෙනවා. එකක් තමයි අපි සභාවට එන්න කලින් පසුගිය කාලේ නාම පුවරු සකස් කිරීමක් සිදුවෙලා තියෙනවා. ගම් වල පාරවල් වලට නාම පුවරු සවි කරලා තියෙනවා. නමුත් සමහර පාරවල් වලට කාලයක් තිස්සෙතිබුන නම නැතුව අලුත් නම් යොදල තියෙනවා. ගෝණදෙනිය දිසානායක මාවත, ගෝණදෙනිය පහල මාවත කියලා නමකින් නම් කරලා තියෙනවා. ඊයේ පෙරේදා වෙනකන් ඒ බෝඩ් එක තිබුනත් දැන් නැහැ. සභාවෙන් ඉවත් කරල ද දන්නේ නැහැ. දිසානායක මාවත කියලා අතින් ලියපු බෝඩ් එකක් එල්ලලා තියෙනවා. ඒක ඉතා අවලස්සනයි. ඒක සකස් කරන මෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපේ සභාවේ සේවක හිඟයක් තියෙනවා කියලා අපට දැනිලා තියෙනවා. මොකද මාගර් කම්කරුවන් ගත්තම ඉතා සීමිත ප්‍රමාණයක් සිටින නිසා යම් යම්කාර්යන් කිරීමේදී ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දී තියෙනවා. මොකද මාගර් කම්කරුවන් හය හත් දෙනකුට කරන්න බැරි තරමේ කාර්යන් රාශියක් තියෙනවා. ඒ නිසා පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් හෝ අවසරයක් ලබාගෙන. තාවකාලික පදනම මත හෝ බඳවා ගැනීම් සිදු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපේ ප්‍රදේශයේ පාරවල් දැඩි ලඳු කැලෑවලින් ගහන වෙලා තියනවා. ඒ නිසා අපරාධ ඒ වගේම යම් යම් විසකුරු සපර්යන්ගෙන් හානි වෙන්න තියන ඉඩකඩ වැඩියි. ඒ නිසා මේ මාගර් පද්ධතිය ශුද්ධ කරන්න මාගර් කම්කරුවන් යොදවන ලෙස ඉල්ලා සිටිනවා. ඒ වගේම රියැදුරන්ගේ ද ලොකු අඩුවක් තියෙනවා. සමහර වෙලාවට වතුර බවුසර්, කුනු අදින රථ සඳහා රියදුරු මහත්තුරු නැහැ. ඒ ගැනත් සලකා බලා කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. පසුගිය දවසක උඩුගම පාසලෙන් වතුර බවුසරයක් ඉල්ලුම් කළා. රාජ්‍ය ආයතනයකින් වතුර බවුසරයක් ඉල්ලුම් කලාම මුදලක් අය නොකර දෙන්න වැඩපිළිවෙළක් තියෙනවද කියලා මම දන්නේ නැහැ. එහෙම පොදු වැඩකට ප්‍රාදේශීය සභා විදියට මැදිහත් වෙලා නොමිලේ ලබා දෙන්න පුළුවන්කමක් තියෙනවා නම්, ඒක ජනතා සේවයක් කියලා මම හිතනවා. ඒ නිසා ඒ ඒ අවස්ථාව සඳහා යම්කිසි වැඩපිළිවෙළක් අපට ගැලපෙන විදියට සකස් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

කුණු අදින ටැක්ටර් රථ දෙකම අබලන් වෙලා කුණු අදින්නෙ කියුබ් තුනේ ටිපර් රථයකින් ටිපර් රථයට කුණු බාස්කට් එක උස්සලා දෙන්න අමාරුයි ගොඩක් උසයි. ඒ නිසා මම හිතනවා ටිපර් රථය වෙන දෙයකට යොමු කරලා ටැක්ටර් රථ දෙක කුණු අදින්න යොදාගන්නවා නම් සුදුසුයි කියලා යෝජනා කරනවා. ඒ වගේම රියදුරු මහත්වරු දෙදෙනෙක් සහිතව ට්‍රැක්ටර් දෙකක් දෙපැත්තකට යවන්න තියෙනවනම් වඩාත් සුදුසුයි. කලින් ටැක්ටර් රථ දෙකක් පැති දෙකකින් ක්‍රියාත්මක වුණා. එවිට කුණු ඇදීම මීට වඩා කාර්යක්ෂම වෙයි කියලා මම යෝජනා කරනව.ටැක්ටර් ඉන්ජින් තියෙන නිසා අවශ්‍ය ටේලර් සකස් කරගෙන හෝ ලබාගෙන ඒ සම්බන්ද වැඩපිළිවෙලක් සකස් කරනවන නම් කුණු ඇදීම මීට වඩා කාර්යක්ෂම වෙයි කියලා මම යෝජනා කරනව. ඔබ සැමට බොහොම ස්තුතියි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. මාපලගම බස් නැවතුම් පොළේ සිට කොළඹ කඩේ ප්‍රදේශය දක්වා අධික පානීය ජල හිඟයක් පවතිනවා. ඒ පිළිබඳව ඔබතුමාට වාතර්‍ා වෙලා ඇති. අලුත් පහල කොට්ඨාසෙ ජල සමිතියක් පිහිටුවලා ජලය බෙදා දීම සඳහා ඉඩමක් පරිත්‍යාග කරන්න පුළුවන් කාන්තාවක් ඉන්නව. සමිතිය පිහිටුවන්න කලින් දැනගන්න ඕන. සභාවෙන් කරන්න පුළුවන් මොකක්ද කියලා මට දැනගන්න ඕන. සාමාන්‍යයෙන් සමිතිය පිහිටවන්න කලින් අරමුදක් තියෙන්න ඕන. ඊට පස්සේ අපට ගමෙන් එකතු කරගන්න පුළුවන්. රජයෙනුත් ගන්න පුලුවන් තත්වයක් තියෙනව.එනිසා සභාවෙ ජල ව්‍යාපෘතිවල ඉතුරු මුදල් තිබෙනවානම් මේකට දෙන්න පුලුවන් මුදල දැනගන්න කැමතියි. මේ යෝජනාව ගිය වර සභාවට ඉදිරිපත් කර සම්මත වෙලා තියෙනවා. මේ පිළිබඳ මට දැන්ම දැනගන්න අවශ්‍යයි. මොකද නැත්නම් සමිතියක් පිහිටුවා මුදල් නැති වුනොත් මම අපහසුතාවයට පත්වෙනවා. ලේකම්තුමිය දැනුම් දුන්නා සභාවත් සමඟ ප්‍රජා මූල්‍ය මණ්ඩලයක් පිහිටුවන ලෙස. මේ වැඩසටහනට නන්දන මන්ත්‍රීතුමාගේ වසන්ත මන්ත්‍රීතුමාගේ සහයෝගය අපි බලාපොරොත්තු වෙනවා. මට ඒ ප්‍රජා මූල මණ්ඩලයක් පිහිටුවන්න අදාල නිලධාරි මහතා සම්බන්ධ කරලා දෙන්න කියලා ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමා අර වීථි ලාම්පු වලට මොකද වුනේ. දැන් සල්ලි නැද්ද. මට මෙහෙන් කම්කරුවෙක් දෙනවනම් මම කොළඹ ගිහිල්ලා ඔය බඩු ටික බස් එකක දාගෙන එන්නම්. මට සත පහක්වත් එපා. මම ඉල්ලන්නේ ගෙවල් වටේ දාන්න නෙවෙයි. මාපලගම හන්දියයි තල්ගස්වල හංදියෙයි වීථි ලාම්පු ටික දාල දෙන්න.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. මුලින්ම කියන්න ඕන. අපේ සභාවෙ විෂයපථය වෙලා තියෙන්නේ උපතේ සිට මරණය දක්වා කටයුතු කිරීම. ඒ විෂය පථයට අනුව අපේ ප්‍රදේශයේ තියෙන සුසාන භූමි ප්‍රමාණය ගැන අපි හැමදාම තොරතුරු ඉල්ලනවා. නමුත් තවම ලැබුණේ නැහැ. ඒ වගේම යටලමත්ත හන්දියෙ බස් හෝල්ට් එකක් නැහැ. මිනිස්සු බස් එකට නඟින්න ඉන්නේ සුමනසේකර අයියගෙ කඩේ ළඟ. ඊයෙත් පොඩි ළමයෙක් යටවෙන්න ගියා. ඔබතුමා අපට එතනින් ඉඩ ප්‍රමාණයක් ලබා දෙන්න අපි සූදානම් එතන බස් හෝල්ට් එකක් හදන්න.

ඒ වගේම තල්ගස්වල පොළ ගැන අපි නිරීක්ෂණයක යෙදුන. ගිය සතියට කලින් සතියේ සිරස වාතර්ාකරු මට කතා කරලා වීඩියෝ එකක් පෙන්නුවා. පොදු වැසිකිළිය ඇතුලේ තමයි ගෝවා සහ වෙනත් එළවලු දාලා තිබුණෙ. මම ඒ ගැන සොයා බැලුවා. ඒ සිද්ධිය ඇත්ත. සභාවෙ පොළ ගැන මාධ්‍යයෙ ප්‍රචාරය වුනොත් අපට හොඳ නැහැ.එනිසා ඒක වලක්වල,පොළට බඩු ගේන පිටිගල මහත්තයා කියන මුදලාලි හමුවෙල මීට පස්සේ එවැනි වැඩ නොකරන ලෙස අවවාද කළා. නැත්නම් සභාවක් විදියට අපට හොඳ නැහැ. අන්න ඒ වගේ වැරදි සිදුවෙනවා. ඒ වගේම තමයි කුණු ගේන්න පොළට ගියාට පොළ ඇතුලේ කුණු අරගෙන නැහැ. ඒ වගේම තමයි එහා පැත්තෙ දොරුවක් තියනවා. ඒ දොරුවෙන් කබරු, හරක් වැනි සතුන් ඇවිල්ලා මාළු ලෑල්ල උඩ ලැගලා ගොම පවා තියෙනවා. මට පෙන්නුවා මෙන්න සුද්ද කරපු හැටි කියල.මුදලාලිලා මගෙන් ඇහුවා සභාවේ කම්කරුවෝ කී දෙනෙක් ඉන්නවද කියලා. ඇත්තටම ඒ වෙලාවේ අපි අපහසුතාවයට පත්වුණා. ඒ වගේම එහා පැත්තෙ තියෙනව බිල්ඩින් එකක් පාවිච්චි නොකරන ඒකෙ කුටිවල බෝතල්,ඉටිකොල, ඒ වගේම ලිද අසල ගොඩක් අපවිත්‍ර වෙලා තියෙනවා. ඒ වගේම විදුලිය ලබා දීමෙ කිසිම ප්‍රමිතියක් නැහැ. ස්විච් බෝඩ් ගලවලා දාලා එය ඉතා අනතුරුදායක තත්ත්වයක්.නොදැන එතනට ලංවුනොත් ජීවිත හානියක් පවා සිදු විය හකියි.

ඒ වගේම ගරු සභාපතිතුමනි සෞඛ්‍ය සේවාව ගැන නිසි බලධාරීන් දැනුවත් කරන්න. මේ P.H.I මහත්තරු කිසිම ගමකට යන්නේ නැහැ. කිසිම සැලකිල්ලක් දක්වන්නේ නැහැ. පාරවල් අයිනේ කුකුල් කූඩු, එලු කූඩු තියෙනවා. ඒවයින් එන හුමාලය මිනිස්සුන්ට දරාගන්න බැහැ. මේ නිසා සමහර පළාත්වල මහා විනාශයක් ඇති වෙලා. මොකද මෙයින් ලෙඩදුක් හැදෙනවා. ඒ ගැන කමිටුව හරහා ඔබතුමාවත් දැනුවත් කිරීමක් සිදු කරන්න.

ඒ වගේම මත්ද්‍රව්‍ය ව්‍යාපාරය දැන් විශාල වශයෙන් පැතිරිලා යනවා. ඊයේ පෙරේදත් කේරල ගංජා අහුවුණා. මේ පිළිබඳ පොලීසිය හරියට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මොකද පොලිසියේ ඕනෑ එපාකම් පිරිමහ ගන්න කොටසක් තමයි මේවා කරන්නේ. වැඩි දුරක නෙවෙයි. පොලිසිය ඉස්සරහමයි ගන්ජා අහුවුණේ. පොලිසිය ඉදිරිපිටදී වුවත් මේවට කිසි ක්‍රියාමාගර්යක් අරගෙන නැහැ. ඔබතුමා ඒ ගැනත් අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි අපේ මේ මාධ්‍ය ගැන කතා කරනවා නම්, අපට මෙතන මාධ්‍ය කරුවන් නැහැ. අපේ තොරතුරු පිටතට යන්න ඕන. එතුමන්ල මට කිව්වෙ මෙහෙන් එන්න කියලා ලියුමක් එව්වේ නැහැල්ලු. ඒ නිසා ලේකම්තුමියනි, ගරු සභාපතිතුමනි ලිපියක් යවලා මාධ්‍ය කරුවන් කැඳවන්න.

ඒවගේම J.C.B. යන්ත්‍රය ගැන කතා කළා. පරීක්ෂාවකින් තොරව ඒක විකුණන්න වෙන්දේසි කරන්න කියලා අපට කියන්න බැහැ. සත්‍ය තොරතුරු අපි ලබාදෙන්නම්. ප්‍රශ්න නිරාකරණය වුණාට පස්සේ ඔබතුමාලාතීරණය කරන්න. අපි මෙතනට ආවේ දූෂණය වංචාව නැති කරන්න. නමුත් දැන් එහෙම වෙනවද කියලා සැකයකුත් තියෙනවා. ඒ වගේම ගරු සභාපතිතුමා අපේ පියල් මන්ත්‍රීතුමා කතා කළ වීථි ලාම්පු ප්‍රශ්නය. අපේ පන්සලේ හාමුදුරුවෝ නිතරම කතා කරනවා. පියල් මන්ත්‍රීතුමාට පන්සලට එන්නත් තහනම් කරලා තියෙන්නෙ. ඒ වගේම කුඹුරු හේනට වීථි ලාම්පු හතයි තියෙන්නේ. කොළඹ කඩේ ළඟ ඉඳලා කුඹුරුහේනට ඒ වීදි ලාම්පු 7

ලබාදෙන්න කියලා මම ගිය සැරෙත් යෝජනාවක් ගෙනාවා. ගරු සභාපතිතුමනි මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ ඒ වීදි ලාම්පු ටික ඉක්මනින් ලබා දෙන්න කියලා.

ඒ වගේම වෙන සභා දිහා බැලුවම අපට සතුටුයි. අපේ සහෝදර මන්ත්‍රීවරු හැසිරෙන ආකාරය ගොඩක් හොඳයි. මාධ්‍යයෙන් ඊයෙත් දකින්න ඇති වෙනත් සභාවල තත්වය. මෙවන් සභාපතිකෙනෙකු, ලේකම්තුමිය ඒ වගේම අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු ඉන්න සභාවක ඇත්තටම සතුටුයි. අපි සාධාරණව නීතිගරුකව ක්‍රමවේදයකට ඉදිරියට ගමන් කරමු. එසේ ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා ස්තූතියි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ධමර්සිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේ මට නම් කියන්න දෙයක් නැහැ. මට මගේ ව්‍යාපාරික කටයුත්තක් සඳහා මෙතනින් බැහැර වීමට අවස්ථාව ලබාදෙනවා නම් ඉතාමත් වටිනවා. පස්වරු දෙකට කලින් බැංකුවට යා යුතුයි ඒ අවස්ථාව ලබාදෙනවා නම් හොඳයි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා , ලේකම්තුමිය ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. මම වැඩි වෙලා කතා කරන්නෙ නැහැ. කතා කරන්න දෙයකුත් නැහැ. නමුත් සභාපතිතුමනි , එක දෙයක් කතා කරන්න ඕන. මාපලගම මංසන්ධියේ වැසිකිළි කැසිකිළි පද්ධතියෙ තත්වය කොහොමද කියලා දන්නේ නැහැ. අපි දිගින් දිගටම ඔබතුමාට කිව්වා මේක ඉක්මනට පටන් ගන්න කියල. අපෙන් මිනිස්සු අහනවා. ඒ වැඩෙත් දැන් යට ගහනවද කියල. මම කිව්වා නැහැ, මන්ත්‍රීවරු හැටියට අපි ඒකට පූණර් අනුමැතිය ලබාදීලා තියෙනවා. අපේ ආසන සංවිධායකතුමා දැනුවත් කර තිබෙනවා. එනිසා තවත් පරක්කු කරන්නෙ නැතුව ආරම්භ කරන්න. දෙසැම්බර් මාසෙට තව ටික දවසයි තියෙන්නේ. මොකක් හරි ප්‍රශ්නයක් ආවොත් අපි ඔක්කොම ඔබතුමත් එක්ක ඉන්නවා. මේක අත්‍යවශ්‍ය කටයුත්තක්.

ඒ වගේම ගරු සභාපතිතුමනි, පියල් මන්ත්‍රීතුමා සඳහන් කළා වගේ මාපලගම මංසන්ධියේ ලයිට් ටිකනම් මම හිතන්නේ ගලවගෙන ආවා. ඒක වෙන කොහේ හරි හයි කළා ද. නැත්නම් ලයිට් ටික තියනවද? ඒක හයි කරන්න පුළුවන් වෙයිද? කොහොමහරි ඉක්මනට ඒ ටිකත් සකස් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

මාපලගම මංසන්ධියේ පාලම අසල තියෙන තොටුපළවල් දෙක ගැන අපේ රංජිත් මන්ත්‍රීතුමා කතා කළා. සභාපතිතුමනි, තොටුපළවල් හදන්න මේක තමයි හොඳම වෙලාව. මොකද ගඟේ වතුර හොඳටම බැහැලා. මේ තොටුපලවල් දෙක හැදුවොත් දාස් ගානකට ප්‍රයෝජනවත් වෙනවා. මොකද ගඟට බහින්න තියෙන පහසුම ස්ථාන තමයි මේ තොටුපලවල් දෙක. දැන් ඔබතුමා සතුව යම් ස්ථාවර මුදලක් තියෙනවා. මේකෙන් කොටසක් වියදම් කරලා තොටුපලවල් දෙක අලුත්වැඩියා කරලා දෙන්න. මේකට මහා ලොකු මුදලක් යන්නේ නැහැ. හොඳටම ඕන නම් එක තොටුපලකට රුපියල් තිස් දහස බැගින් තොටුපළවල් දෙකට හැට දහසක් යාවි. ඔබතුමාගේ සභාවේ වැඩ කටයුත්තක් හැටියට සභාවට අයිති තොටුපළවල් දෙකක් හැටියට මෙය අලුත්වැඩියා කරලා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමා කසල අදින අත්ටැක්ටර් එන්ජින් හයක් විතර තියෙනව කියල කතා වුනා. දැනට පාවිච්චි කරන්න පුළුවන් ට්‍රේලර් එකක් පමණක් බව කිව්ව. අපේ හිටපු විලේගේ සභාපති තුමාගේ කාලෙත් එක ට්‍රේලරයක් ද කොහෙද අලුත් වැඩියා කලා. මේ ට්‍රේලර් ටික අලුත්වැඩියා කරලා අපට තියෙන වාහන ටික පරිස්සම් කර ගන්න ක්‍රමයක් හැදුවොත් හොඳයි. මොකද දැනට කුණු අදින්නේ ටිපර් රථයෙන් ඒකත් ඉක්මනට අබලන් වෙනවා. ඒ කාලේ නම් ට්‍රේලර් එකක් අලුත්වැඩියා කරන්න ගියේ රුපියල් එක් ලක්ෂ තිස් දාහක් වගේ මුදලක්. මේ කටයුත්ත සොයාබලා සිදු කරන්න කියල ඉල්ලා සිටිනවා.මොකද ටිපර් රථය අබලන් වුනොත් අලුත්වැඩියා කරන්න විශාල මුදලක් වැය වෙනවා.

ගරු සභාපතිතුමනි, මේ දිනවල තියෙන ජල හිඟය පිළිබඳව පියල් මන්ත්‍රීතුමාත් කතා කළා. මාපලගම මංසන්ධියේ පදිංචි අයට මේක දැඩි ලෙස බලපානවා. ඒ වගේම මාපලගම ඉඳලා ඉහලට දිගටම මිනිස්සුන්ට වතුර බොන්න වත් නැහැ. ඒ නිවෙස් කීපයකින් මගෙන් ඉල්ලීමකුත් කළා සභාවේ බවුසරය හරි යොදවලා ටැංකි ටිකක් අතරින් පතර හරි තියල වතුර ටිකක් ලබාදෙන්න කියලා. මෙවැනි දැඩි නියගය පවතින වෙලාවක මිනිසුන්ට ජලය ලබාදෙන එක අපේ යුතුකමක්. මොකද මේ නියඟය කොතනින් කොයි දවසේ ඉවර වෙයිද කියලා කියන්න බැහැ. ප්‍රාදේශීය සභාවේ වගකීම යුතුකම ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ට කරල දෙන එක. පුලුවන්නම් වතුර ටැංකි තියලා බවුසර වලින් උදේ හවස ඒ ටැංකි පුරවල තිව්වොත් මිනිස්සුන්ට අඩුගානේ බොන්න හරි වතුර ටිකක් ලබා ගන්න පුලුවන්. මාපලගම ප්‍රදේශය වගේම අනිත් ප්‍රදේශවලත් ඒ වගේ ඇති. නාගොඩ ඉහල හරිය කඳු ප්‍රදේශ වල නම් ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. මල්වත්තහේන වාඩිය කන්ද පැත්තටත් ඔය ජල ප්‍රශ්නය තියෙනවා. නමුත් ඒ අයට වාඩියකන්ද ප්‍රදේශයෙන් කොහොමහරි ඒ කටයුතු ටික කරගන්න හැකියාව තියෙනවා. නමුත් ප්‍රධාන මාගර් අසල මේ ජලය සපයන වැඩපිළිවෙළක් හදාගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

අද අපේ J.C.B. යන්ත්‍රය ගැන කතා කළා . ඉතින් මම හිතනවා පමා වෙලා හරි අපේ මන්ත්‍රීවරු තේරුම්ගත්ත එක හොඳයි. පසුගිය කාලෙ වුන සිදු වීම් පිළිබඳව. සභාපතිතුමා මේවා නිවැරදි කරලා අපි ඉදිරියට යමු කියල කිව්වත් ,අපට නම් මේවා කවදාකවත් අමතක කරන්න බැහැ. ඒ දවස්වල අපි හිටපු පාලකයොත් එක්ක වාද විවාද කළා. ඔබතුමාත් හිටිය, එඩේරආරච්චි මන්ත්‍රීතුමාත්, නන්දන මන්ත්‍රීතුමාත් අපි දිගින් දිගටම ඒ ගැන කතා කළා. ඒවයෙ ප්‍රතිඵල තමයි අද අපට අත්වෙලා තියෙන්නේ. අද J.C.B. යන්ත්‍රය තිබුනා නම් ඔබතුමාලගේ කොට්ඨාසවල ලොකු වැඩ කොටසක් කර ගන්න තිබුණා. ඒ කාලේ නිසි පරිපාලනයක් නොතිබුණු නිසා. ඒකෙන් විවිධ අය වාසි ගත්තා. ඒක නිසා තමයි අපි දිගින් දිගටම ඒ ගැන කතා කළේ.

ඒ වගේම පහුගිය දවස්වල පාගමන ගිහිල්ලා ඔබතුමාලාට අමාරුත් ඇති. අපි ඒ පිළිබඳ කතා කරන්නේ නැහැ. සමහර අය පාරවල් අයිනේ නිදාගෙන හිටියා. සමහර අය ඉස්පිරිතාලෙටත් ගියා. හොඳ වෙලාවට 1990 ඇම්බියුලන්ස් සේවාව තිබුණෙ. ඒ පා ගමන සංවිධානය කරලා අපට, එක්සත් ජාතික පක්ෂයට ලොකු ශක්තියක් ලබලා දුන්නා. ගරු සභාපතිතුමනි මේ වෙලාවේ අපි හරි ගමනක යනවා. රට නිවැරැදි මාගර්යක යනවා. තමුන්නාන්සේලා ඔය පැරණි පොඩි පොඩි අමනාපකම් මතභේද අමතක කරලා අපිත් එක්ක මේ ගමන යමු. එතකොට රටක් හැටියට රට හදා ගන්න පුළුවන්. නැත්නම් ඔබතුමාලගේ ඒ හීන හා පැතුම් ඉෂ්ඨ වෙන්නෙ නැහැ. ඒ නිසා මේ කාලේ හැටියට අපි රට යන අතට ගිහිල්ලා මැස්ස ගහලා ඉවරවෙලා අපි කවුරුත් එක්ක එක බෝට්ටුවෙ නැගලා රටේ අනාගතය ගැන තීන්දු තීරණ ගනිමු කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. ඔබ සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මමත් නැඟී සිටියේ කවුරුත් තොටුපළවල් ගැන කතා කරන ජල හිඟතාවයක් තිබෙන මේ අවස්ථාවෙ. මගේ පලවෙනි යෝජනාව ලෙස සභාව සතු ඇතුමලේ ප්‍රධාන තොටුපල සංරක්ෂණය කිරීම සුදුසු බව යෝජනා කරලා තිබෙනවා. දැන් වතුර අඩු නිසා එය සිදු කිරීමට සුදුසු බව මම හිතනවා. යටත් විජිත කාලයේ අපේ පුරාවිද්‍යා දෙපාතර්මේන්තුවෙන් එම ස්ථානය පැරණි ස්ථානයක් ලෙස නම් කරලා තියෙනවා. එය අතීතයේ තොරතුරු හොයන අයට කදිම තෝතැන්නක් වේවි. ඒ නිසා ඒ තොටුපල ඒ උරුමය සංරක්ෂණය කරලා තියෙනවා නම් ගොඩක්ම හොඳයි කියලා මම හිතනවා. රූප සටහන් පෙන්වමින්, රූප සටහන් මගින් තිබුන ජැටිය,ගැලවිලා තියෙන ගල් පෙන්නුම් කරලා තියෙනවා. මේ ආකාරයට තමයි පෞරාණිකව තිබිලා තියෙන්නේ මේ විදියට තමයි මේ ස්ථානය තිබිය යුත්තේ. පුරාවිද්‍යා ආයතනය දැනුවත් කළොත් එතුමන්ලා අපට මේක කරලා දෙනවා. ඒ නිසා මම ඒ පිළිබඳවත් සභාපතිතුමා,ලේකම් තමිය දැනුවත් කරනවා. පුරාවිද්‍යා ආයතනය දැනුවත් කරලා මෙතන පුරාවිද්‍යා ස්ථානයක් හැටියට නම් කරල පුරාවිද්‍යා ස්මාරකයක් හදන්න කටයුතු කරන්න කියල ඉල්ලා සිටිනවා.එමගින් සභාවට ආදායමක් ලබා ගන්නත් පුලුවන්. ඒ වගේම නාගොඩ ප්‍රාදේශීය සභාවට අයිති පුරාවිද්‍යා ස්ථාන තුනක් තියෙනවා නාගොඩ ජයසිංහරාම පුරාණ විහාරය, පැරණි ධමර් ශාලාව හා බෙම්බඩ අම්බලම දැන් එතන

අම්බලම නැහැ පොළොව විතරයි තියෙන්නේ. අපේ අනාගත පරපුර වෙනුවෙන් ඉදිරියේදී ළමයින්ට පෞරාණික ස්ථාන ලෙස දැනගන්න පුළුවන් විදියට අපි ඒ ඒ ස්ථාන නම් කරලා හදා හදාගත්තොත් ගොඩක් වටිනවා. එයත් සභාපතිතුමාට සිහිපත් කරනවා.

මගේ දෙවන යෝජනාව ලෙස, අපේ ප්‍රාදේශීය සභාවට ළමා ක්‍රීඩා පිටියක් සකස් කරන්න ඉදිරියට එන ළමා දිනය නිමිති කරගෙන. අපේ ළමයි ක්‍රීඩා පිටියක් සඳහා ගාල්ලටම අරගෙන යන්න ඕන. අපේ බල ප්‍රදේශයේ තේ දළු වැනි කමර්ාන්තවල නියැලිලා ඉන්න දෙමව්පියන්ට ආථර්ික ප්‍රශ්න වැඩියි. ඒ නිසා ළමයින් එසේ අරගෙන යන්න හැකියාවක්,වෙලාවක් නැහැ. ඒ නිසා අපේ ප්‍රාදේශීය සභාවට ළමා ක්‍රීඩාපිටියක් ඇති කිරීම සුදුසුයි. ඒ වගේම වෙරංග මන්ත්‍රීතුමා කියපු උඩුගම ක්‍රීඩාපිටිය ළමා ක්‍රීඩා පිටිය සඳහා සුදුසුයි කියලා මම හිතනවා.

ඒ වගේම මගේ තුන්වන යෝජනාව තමයි අපේ බලප්‍රදේශය පටන් ගන්නා ස්ථාන සහ අවසන් වන ස්ථානවල ප්‍රදශර්නය කර ඇති නාම පුවරු දැන් අභාවයට ගොස් තියෙනවා. එබැවින් ලස්සනට නිවැරදිව නාමපුවරු නැවත සවි කරන්න කියලා මම යෝජනා කරනවා. ඒ වගේම සභාපතිතුමනි මේ යෝජනා කෙසේ හෝ ඉටුකර ගැනීමට හැකිවේවායි පතමින් මම නිහඬ වෙනවා. ඔබ සැමට ස්තුතියි.

### ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා

ගරු සභාපතිතුමනි, නියෝජ්‍ය සභාපති තුමා ඇතුළු සමස්ත මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරිනි, දීඝර් වශයෙන් කතා කළා. අපි සියලු දෙනාම අද බලාපොරොත්තු වුණේ මෙහෙම දෙයක් නෙවෙයි. තමුන්නාන්සේලා පස් වෙනිදා කොළඹ ගිහිල්ලා නිදි වරන කොට අපිත් නිදි වරාගෙන රූපවාහිනිය දිහා බලාගෙන හිටියා. මොකද මේ සභාවේ බලය පොහොට්ටුවට ගියා වගේම එළිවෙනකොට මහින්ද රාජපක්ෂ මහත්තයා දිවුරුම් දීලා තමුන්නාන්සේලාගේ කැබිනට් එකක් පත්කරලා මේ සභාවල් වල සභාපතිවරුන්ට සහ මන්ත්‍රීවරුන්ට ලොකු හයියක් ලැබෙයි කියලා. නමුත් බලනකොට අප්පුඩියෙ සද්දේ විතරයි. වැඩ පුස්සක් වුණා. නිදි වරන්න කිසි කෙනෙක් හිටියේ නැහැ. ගිය උදවිය රෑ නවය වන විට ඇවිල්ලා ඉවරයි. අපි මාධ්‍යයෙන් තමුන්නාන්සේලා යන දිහා බැලුවා. මෙහෙන් කවුද ගියේ මෙහේට කවුද ආවෙ කියලා බැලුවා. ආණ්ඩුව පෙරලන හැටි බැලුවා. දිවුරුම් දෙන හැටි බැලුවා. නමුත් මේ කිසි දෙයක් දකින්න ලැබුනේ නැහැ. පුස් වෙඩිල්ලක් විතරයි. නමුත් මම කියන්න කැමතියි අපේ බලමණ්ඩල රැස්වීම තල්ගස්වල අලුත් තෙල් පිරවුම් හල අසල තිබුනා. නාගොඩ, නියාගම කණ්ඩායම් දෙක විතරයි එකතු වුනේ. අපි පුටු 1000යි කිරි පැකට් 1000 යි ගෙනාවා. නමුත් ඒ සියල්ල මදිවුණා. එක්දහස් පන්සියයකට වැඩි ජනතාවක් හිටියා. අපේ සංවිධානය බොහොම හිම්හිට කරපු සංවිධානයක්. තමුන්නාන්සේලා අද බලාපොරොත්තුවිනාශ වුනු පිරිසක් ඒ නිසා මොනවා කිව්වත් ගණන් ගන්නේ නැහැ.

ඒ වගේම තමුන්නාන්සේලා දැන් වතුර නැත කයල කියන කොට මට ඉතිහාසෙ මතක් වුනා. අපේ දිසානායක මන්ත්‍රීතුමා කිව්වා එක ටැංකියක් තිබුන කියලා. නමුත් ඉතිහාසය දිහා බලන්න ඒ ටැංකි දාහතම තිබුණනම් මේ බවුසර් ටික තියෙනවා. හන්දියක් හන්දියක් ගානේ ටැංකි තියලා කිසි ප්‍රශ්නයක් නැතුව ජනතාවට වතුර ටික බෙදා දෙන්න තිබුනා. තමුන්නාන්සේලා කරපු දේවල්වල ප්‍රතිඵල මේ ලැබිලා තියෙන්නෙ. මේවා දිට්ඨධම්මවේදනීය කමර්. ඒදා ගඟේ වැලි ගොඩ දාන කොට හඟ මකන කොට අපි විරුද්ධ වුනා පාරට බැස්ස ඔහොම කරන්න එපා අනාගතයේ දරුවන්ට මේ ඉරණම අත් වෙයි කියලා. තමුන්නාන්සේත් එදා විරුද්ධ වුණා. අද ගඟ දිහා බලන්න එදා ගලපු නිල් ජලය අද තිබුන නම්, උදේට අම්මලා කළගෙඩියක් අරන් ගිහිල්ලා බොන්න වතුර ගේනවා. පිරිසුදු ජලය ගඟේ තිබුනා. ඒ වගේ තිබුණ ගඟ මේ තත්ත්වයට පත් කළේ ඔබතුමන්ලගේ පාලන කාලේ. අපි මේවා කතා කරනකොට ඔබතුමාලා වැඩක් නැහැ කියාවි. වැලිවිටියෙ තිබුණ ටැංකියක්, දිසානායක මන්ත්‍රීතුමා කිව්වා තව එකක් කොහෙද තිබිල ගෙනවා කියලා. ඒ දෙක විතරයි තියෙන්නෙ. මේක තමයි ඉතිහාසය. ඕක තමයි සත්‍ය තත්වය.

ඊළඟට අපේ මේ මන්ත්‍රීතුමා කිව්වා කම්කරු මහත්තරු අඩුයි කියල. මම දන්න විදිහට කම්කරු මහත්වරුන්ගේ අඩුවක් නැහැ. කරුණාකරලා ඉල්ලනව ලබන සභාවට හරි දැනට කම්කරු මහත්තරු කොපමණ ඉන්නවද? කියලා වාතර්ාවක් ලබා දෙන්න. එතකොට අපට දැනගන්න පුළුවන් ඒ අය වැඩ කරනවද? ඒ මහත්තරු වෙනත්

කායර්යන්වලට යොදවලද කියලා. අපට දකින්න ලැබෙන්නේ තුන්දෙනයි නැත්නම් හතර දෙනයි. දැන් මේවා වචනයෙන් යෝජනා කරලා ඉල්ලනවා වගේම අද බැරිනම් ලබන සභාවට හරි කරුණාකර ඉදිරිපත් කරන්න.

අද අපි තමුන්නාන්සේලා වැඩ කරන්නේ අඩුපාඩු තියන මෙවැනි තත්ත්වයක. මම පසුගිය දවසක මාපලගම ප්‍රදේශයේ ක්‍රීඩාපිටිය අසලින් යනවිට දැක්ක ක්‍රීඩාපිටියෙ ගල් ගොඩක් තියෙනවා. අනිත් පැත්තෙ පොල්මුල් දෙකක් තියෙනවා. මේ ක්‍රීඩා පිටියට හවසට එන්නේ අහිංසක දරුවො ක්‍රීඩා කරන්න විදියක් නැහැ. ගල් උඩ වාඩිවෙලා බලාගෙන ඉන්නවා. පොල් මුල් ගෙනත් දාලා තියෙන්නේ බැකෝ යන්ත්‍රවලින්. පසුගිය දවස්වල කම්කරු මහත්තුරු ගිහිල්ලා මේක සුද්ද කරනකොට අපේ නිලධාරි මහත්තුරුත් යන්න ඇති. මම අහන්නේ ඒ පැමිණිල්ල මෙතෙන්ට ආව ද? මොකද වුනේ කියන එක. මේ ක්‍රීඩා පිටියට ගල් දැම්මෙ තමුන්නාන්සේගෙන් අහල නම් පොල් මුල දැම්මෙත් අහලා ද? ඒක මේ වෙනතුරු ඉවත් වෙලා නැහැ. අපි ප්‍රාදේශීය සභාවේ යුනිෆෝම්ඒ එකත් ඇඳගෙන බස් එකක් එනකන් ක්‍රීඩාපිටිය ළඟ ඉන්න අවස්ථාවක පිටතින් ආපු මහත්මයෙක් මේ සභාවේ ක්‍රීඩාපිටිය නේද? මේක තියෙන්නේ පොල් මුල්, ගල් දාන්නද? කියලා ඇහුවොත් අපි මොනවද කියන්නෙ. ඒක දින එකකට දෙකකට දුන්නට කමක් නැහැ. මම මේ කියන්නෙ මාස 2 කට පෙර වුන සිදුවීමක් ගැන. දැන් මේ මොහොත වන විට පවතින තත්වය ගැන මම දන්නේ නැහැ.මේව පාලනය කරන්න යහ මග පෙන්වන්නෙ.

ඒ වගේම අපිට වාහන තියෙනවා. වාහන තිබුණට මදි ඒවායේ ආරක්ෂාවට මුරකාරයා ඉන්නවානම් ඒ අයට කියන්න. උදාහරණයක් කියනවා නම් අපි මෙතනට ඇවිල්ලා මේක භාරගන්නකොට බයිසිකල් තුනක් තිබුනා. ඒක බාර දෙන කොට බයිසිකල් තුනේ හෙල්මට් නැහැ. එහෙම නැත්නම් පැති කණ්නාඩි නැහැ. එවැනි වාතර්ාවක් මේවට එන්න ඕන. පරීක්ෂණය ආරභ කරන්න ඕන එතන ඉඳලා. අවශ්‍ය වෙලාවට අවශ්‍ය තැනදී අවශ්‍ය දේ කියන්නම්. මෙතන බොරුවට කාලය කා දමන්න ලෑස්ති නැහැ. ඒ නිසා තමයි මම ඉවත් වෙලා ගියේ.

ඒ වගේම තමුන්නාන්සේලා කිව්වා. තෙල් මිලයි කියලා. නමුත් තවම තමුන්නාන්සේලාගේ මිළට ආවෙ නැහැ. තමුන්නාන්සේලා කතා කරනවා බඩු මිලයි කියලා. තවම බඩු මිළ නැහැ. තවම එවැනි උද්ධමනයකට රට ගිහිල්ලා නැහැ. ඒක මෙතන ඉන්න මන්ත්‍රීවරියන් , අම්මලා වශයෙන් දන්නවා. මම මීට වැඩිය තමුන්නාන්සේලාගේ කාලය ගන්න සූදානම් වෙන්නේ නැහැ. අපි මෙතැනට ඇවිල්ලා පස් මාසයක් වෙනවා. මේ යන්නේ හය වෙනි සභාවාරය. මේ ගමනේ වේගය අපට හොඳට ජේනවා. නන්දන මන්ත්‍රීතුමා කිව්වා ලක්ෂ හැට අටක් සභාවෙ තැන්පත්වෙලා තියෙනවා කියලා. නමුත් තවමත් බැරි වුණා ඒ උපකරණ පාවිච්චි කරලා නිවීසැනසිල්ලේ කටයුතු කරන්න. අනිත් පැත්තෙන් අද මම දැක්කා. පොඩි ළමයෙකුගේ ඉඳුල් කටගෑම වගේ උත්සවයක්. උප සභාපතිතුමා මෙතනට ඇවිල්ලා වැඩ බැලුවා. මම ඒක එතුමට අපහාසයක් වෙන්න නෙමෙයි කිව්වෙ. අපට හරි සතුටුයි. මොකද මේ පුටුව මාස හයකින් විතර තමයි ඒ පැත්තට ගියේ. මම මේ අදහස් ප්‍රකාශ කළේ මේකේ නිවැරදි විය යුතු තැන් තියෙන නිසා.

ඊළගට ගරු සභාපතිතුමනි උත්සවයකට ගිහින් සභාපති වරයෙක් හැටියට මන්ත්‍රීවරයෙක් හැටියට කතා කරනකොට අපි කියනවා. දරුවාගේ උප්පත්තියේ සිට අවසානය දක්වා අපට වගකීමක් තියෙනවා කියලා. එහෙනම් මෙවැනි ජල හිගයක් පවතින වෙලාවක මුදල් පස්සේ හඹා යන්නේ නැතිව ටැංකි තියලා බවුසර් තියලා ජනතාවට වතුර දෙන්න පුළුවන් උනා නම් කොපමණ වටිනවාද? විශේෂයෙන්ම මාපලගම පැත්තට තමයි ජල හිගය බහුලව තියෙන්නෙ. ඒක නිසා නාගොඩ හන්දියට එක ටැංකියකුත් , මාපලගමට එක ටැංකියකුත් තියලා වතුර නැතෙයි කියන අපේ අම්මලා තාත්තලාට වතුර දෙන්න කටයුතු කරන්න. ඒ වගේම තව දවසකට ඒ ටැංකිය උඩුගමට තියලා උඩුගම ජනතාවටත් ජලය ලබාදෙන්න කියන යෝජනාව කරනවා. මේවා අපිට සල්ලි හම්බ කරන්න ලැබුනු සම්පත් නෙවෙයි. මේ සියල්ල අපට ලැබිලා තියෙන්නේ ආධාර විදියට. අපි සල්ලි වලට ගත්තු ඒව නෙවෙයි. මේවා නොමිලේ ලැබුනෙ ප්‍රජාව වෙනුවෙන් ප්‍රජාවට සේවයක් කරන්න. මේ කටයුතු ඒ විදියට කරන්න කියලා ඉල්ලා සිටිමින් සියලුදෙනාටම සුබ දවසක් ප්‍රාථර්නා කරමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් හා ලේකම්තුමිය ගෙන් අවසරයි. මේ වෙලාවේ දීසර් වශයෙන් කරුණු ඉදිරිපත් කරන්න නොගියත්, ප්‍රාදේශීය සභාවක් හැටියට මාස හයක ගමන් මග පිළිබඳව කතා කළා. මේ අවස්ථාවේදී මම විශ්වාස කරනවා. මේ ප්‍රාදේශීය සභාව ඉදිරියේ දී නිවැරදි ගමන් මාගර්යක යනවා නම් එහි අඩුපාඩු පෙන්වාදීම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු සියලු දෙනාගෙ යුතුකමක් හා වගකීමක්. මේ වෙලාවෙදි ප්‍රාදේශීය සභාවේ පවතින වැඩපිළිවෙල පිළිබඳව, ගරු සභාපතිතුමා ලොකු කැපකිරීමක් කරනවා. මුදල් පරිපාලනය සම්බන්ධයෙන් හොඳ කළමනාකරණයක් තියෙනවා. නමුත් අපට මීට වැඩිය වැඩ කොටසක් කළ හැකි යැයි මම විශ්වාස කරනවා. ඒ වගේම ප්‍රාදේශීය සභාව තුළ මීට මාස ගණනාවකට පෙර ක්‍රියාත්මක කළ යුතුයි කියන යෝජනා සියල්ල යෝජනා කරලා ඒ සඳහා පසුබිම සකස් කරලා තියෙන වෙලාවක එම කටයුතු ටික නොකෙරෙන්නේ මොකද කියලා ලොකු ප්‍රශ්නයක් තියෙනවා.

ඒ වගේම අපේ මන්ත්‍රී වරයෙක් සඳහන් කළා මංමාවත් පිළිබඳව. දැන් ඉතාමත් කැලේ වැවිලා මේ නියන් කාලයේ රාත්‍රියට පයින් ගමන් කරන අයට ඉතා අනතුරුදායකයි. විෂඝෝර සපර්යන් වතුර සොයාගෙන පාරවල්වල ගමන් කරන අවස්ථා බොහොමයි. ඒ නිසා අපි සභාව තුළ තියෙන තණකොළ මැෂින් ,කම්කරුවන් යොදවලා මේ මාගර් ශුද්ධ කර දෙන මෙන් ඉල්ලා සිටිනවා. එක සතියක එක කොට්ඨාශයක එක පාරක් හරි සුද්ද කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන්න කියන මතක් කිරීම සිදු කරනවා.

ඒ වගේම මාගර් කම්කරුවන් පිළිබඳ නොයෙක් අවස්ථාවල කතා වුණා. අපේ ප්‍රාදේශීය සභාවේ මාගර් සුද්ද කරන්න යන කම්කරුවන් අපේ සභාව ගැන, සභාපතිතුමා, ලේකම් තුමිය, ගැන විවේචනය කරලා තමයි වැඩ පටන් ගන්නේ. එවිට සභාව කෙරෙහි තියෙන ප්‍රතිරූපය සම්පූණර්යෙන්ම විනාශ වෙනවා. මේවට අදාළ රෙකෝඩ් මගේ ළග තියෙනවා. ඒ නිසා ඒ පිළිබඳ ව සංගායනාවක් කළ යුතුයි කියල මම විශ්වාස කරනවා. ගරු සභාපතිතුමනි, ලේකම්තුමියනි ඒ කම්කරුවන් සභාවට කැඳවලා එසේ නොකරන ලෙස අවවාද කරන්න. ඒ වගේම තමයි සභාවට ආවට පස්සෙ අපි මේකෙන් පිටවෙලා යන්නේ දැඩි කලකිරුණු ස්වභාවයකින්. මේ සභාවෙදී අපි කිසි විටක නිලධාරීන්ට ගෙවන දීමනා ,අතිකාල ,ගමන් වියදම් පිළිබඳව විරෝධය ප්‍රකාශ කරල නැහැ. පුහුණු කටයුතුවලට යනවා නම් ඒවා මගහැරියේ නැහැ. නමුත් මේ සභාව තුළ දී තවමත් අපට වීදි ලාම්පු ගෙනෙන්න බැරි වුණා. මුදලුත් තියෙනවා,නියමාකාරයෙන් මිල ගණන් කැඳවලා තියෙනවා. ඒ සියලු දේවල් සූදානම් වෙලා තිබුනත් තවම ගේන්න බැරි වුණා. මේව රාජ්‍ය ආයතනයක් තුළ සිදු නොවිය යුතු දේවල්. මොන ප්‍රශ්න තිබුණත් මේ කටයුතු කරන්න ඕන. එහෙම නොවෙනවානම් අදාල නිලධාරීන්ට පැවරෙන රාජකාරිය සිදු නොවන බව තමයි අපට හැගෙන්නෙ. ඒ වගේම මේ රැස්වීම් ශාලාවට ෆෑන් එකක් හරි, වායු සමනය කරන්න හරි ගනිපු කාලය වැඩියි. උපරිම දින 15 තුළ මේ කටයුතු සිදු කරන්න පුළුවන්. ඵලදායිතාව පිළිබඳ කතාකරනවා නම් මේ ආයතනය තුළ යම් යම් රෙගුලාසි නිමර්ාණය කරලා තියෙනවා.නමුත් මේ රෙගුලාසි වලින් ඔබ්බට ගිහිල්ලා මේවා කරන්න පුළුවන්කම තියෙනවා. එ නිසා මම ඉල්ලීමක් කරනවා මේ කරන යෝජනා පිළිබඳව ගරු සභාපතිතුමා වගේම අපිත් හැම අවස්ථාවකම අපහසුතාවයන්ට පත් වෙනවා මේ කායර්යන් වලදී . එනිසා මේවා පෙන්වා දීම තුළින් මම බලාපොරොත්තු වෙන්නෙ අඩුපාඩු සකස් කර ගැනීම. යම් කායර්යක් සඳහා සභාව අනුමත කලා නම් ඒ කායර්ය පිටි පස්සේ ඉඳලා ඒ කටයුතු අදාළ නිලධාරීන් කරන්න ඕන. මේ නිලධාරීන්ට පහසුකම් සපයල තියෙන්නෙ. ඒ වගේම අපි මාස හයක් තුළ පොදු මහජනතාවට මොනවද කලේ කියලා ඇහුවොත් මේ සභා වාතර්ා ටික අරගෙන, මේ ගෙවීම් වාතර්ා ටික බැලුවොත් අපි මුකුත් කරලා නැහැ. අපි කරලා තියෙන්නේ බිල් ටික ගෙවන එකයි. ගමන් වියදම් ගෙවන එකයි විතරයි. ඒ වගේම අපේ සභාපතිතුමා කරන මේ කැප කිරීම කිසි කෙනෙකුට කරන්න බැහැ. ඒකැප කිරීමේ ප්‍රතිඵල ලබා ගැනීම සඳහා මේ සියලු දෙනාගේ සහයෝගය ලබාදෙන්නයි කියලා ඉල්ලා සිටිනවා. සභාවෙන් ලැබෙන ශක්තිය අල්ප වශයෙන් ලැබෙනවා කියලා මගෙ විශ්වාසය. මම ලේකම්තුමිය ගෙනුත් ඉල්ලා සිටින්නේ නිසි විපරමක් කරලා මේ අදාළ කටයුතු ඊළඟ සභාවට කලින් හරි කරන්න කියලා. අද වෙනකොට කිසි මන්ත්‍රීවරයෙක් සභාවට යෝජනා දාලා නැහැ. මොකද ඒවා ක්‍රියාත්මක නොවෙන නිසා. අපට දැම්මත් දාන්න තියෙන්නේ පසුගිය යෝජනා ටික විතරයි. ඒ නිසා මේ සඳහා මොනවාහරි දෙයක් කරන්නට අවශ්‍ය පරිසරය නිමර්ාණය කර දෙන්න කියන ඉල්ලීම කරනවා. මේවා පෙන්නලා දුන්නේ සභාව පෙරලන්න නෙවෙයි. නමුත් සභාව නිවැරදි මාගර්යට ගත යුතුයි.

එක්සත් ජාතික පක්ෂයේ කිරිපැකට් දාහක් බනිස් 1000 ක් මදිවුනාලු. නිවැරදිව කල්පනා කරල බැලුවම මිනිසුන් කැඳවලා තියෙන්නේ ඉඩම් දෙන්න සමෘද්ධි සහනාධාරය ලබා දෙන්න. ඉතින් ඒ මිනිස්සු බලමණ්ඩලය තියෙනවා කියලා දන්නේ නැහැ. ඔබතුමාට ඕන තරම් පෝස්ටර් ගහන්න පුළුවන්. මොනවහරි දෙනවා කිව්වම මිනිස්සු යනවා. ඒ වගේම සමෘද්ධි සහනාධාරය සම්බන්ධයෙන් අවදානමක් තියෙනවා. මේ වන විට අයදුම්පත් කැඳවලා තියෙනවා. මම ප්‍රාදේශීය ලේකම් කායර්ාලයේ අදාළ අංශවලින් විමසීම් කළ විට අවසාන ලැයිස්තුවක් සකස් කර නොමැති බව පැවසුවා. නමුත් ඔබතුමාලා බලමණ්ඩලයේ දී මෙන්න මේ අයට සමෘද්ධිය තියෙයි කියලා පැහැදිලි පිරිසක් නම් කළා .ඉතින් අපිත් මේවා බලාගෙන ඉන්නවා. අපි කවදාවත් එහෙම පක්ෂ භේදයකින් සමෘද්ධිය දුන්නේ නැහැ. මම අපේ මන්ත්‍රීවරුන්ටත් කියන්නේ සමෘද්ධි සහනාධාර වැඩපිළිවෙළ පිළිබඳ බලාගෙන ඉන්න. මොකද ගමකින් පාක්ෂිකයන් 10කට වගේ ප්‍රමාණයකට පමණක් දෙන්න සූදානම් කරල තියෙනවා. ඒ පිළිබඳව තොරතුරු දැනගැනීමේ පනත අනුව මම ප්‍රාදේශීය ලේකම් කායර්ාලයෙන් ලැබෙන්නේ කාටද කියලා විමසීමක් කළා. නමුත් ප්‍රාදේශීය ලේකම් කායර්ාලයෙන් කියන්නේ තවම එහෙම තොරතුරක් නැහැ කියලා. මම කාටවත් සමෘද්ධිය දීලා නැහැ. ඒ නිසා මතක තියාගන්න අපිත් බලාගෙන ඉන්නවා. අහල බලන්න වැලිවිටියෙ මිනිස්සුන්ගෙ යූ.ඇන්.පි ද ජේ.වී.පී ද ශ්‍රී ලංකාද කියලා සමෘද්ධිය කපලත් නැහැ දීලත් නැහැ.

ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය ලේකම් කායර්ාලය මගින් විශාල ව්‍යාපෘති ප්‍රමාණයක් ක්‍රියාත්මක කරන්න පිඹුරුපත් සකස් කරනවා. සංවධර්න කටයුතු සිදු කිරීමේදී මොන පක්ෂයෙන් වුනත් ඒක අපි අගය කරනවා. නමුත් ගරු සභාපතිතුමනි මේ යෝජනා අනුමත වෙලා ක්‍රියාත්මක වුණාම තමයි ඔබතුමා ලඟට අනුමැතියට එන්නේ. ඒ නිසා එතන පොඩි ගැටලුවක් තියෙනවා. අපේ සමහර මාගර් වලට නඩු තියෙනවා. ලේකම්තුමිය ඒ ගැන දන්නවා. ඒ සඳහා පැමිණිල්ලක් තියෙනවා. අපේ උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ මාගර්යේ කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතිය සඳහා. ඒ මාගර්යට නඩුවක් තියෙනවා. ඒ ගැන අපට දැනුම් දීලා නැහැ. උසාවියට දැනුම් දුන්නේ අපි .එහෙම දැනුවත් වීමත් නැහැයි කියලා. විරුද්ධ නැහැ. අපි කපපු පාර අපි බේරෙන්න වැඩපිළිවෙළක් කරන්න. ගරු සභාපති තුමාටත් ලේකම් තුමියටත් කියන්නේ ප්‍රාදේශීය ලේකම් කායර්ාලය දැනුවත් කරලා ඒ කරන සංවධර්න යෝජනා ගැන අපෙන් අවසර ගන්න කියලා කියන්න. සමහර වෙලාවට ඔබතුමා දන්න තොරතුරු ප්‍රාදේශීය ලේකම් දන්නේ නැහැ. ඒ නිසා මාගර් කොන්ක්‍රීට් කරලා ඇවිත් වැඩක් නැහැ. ඒ වගේම එක එක්කෙනාට පොදු න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක කරන්න සූදානම් වෙනවා. ඒ නිසා ඒ පිළිබඳව සොයා බලා කටයුතු කරන සෙල මතක් කරනව.

සභාපතිතුමනි කැලේ වැවිලා තියෙන අපේ පාරවල් ටික ශුද්ධ කරන්න මේ මැෂින් ටික එලියට ගන්න. අපි හරි කපන්නන්. ඒ කටයුතු ටික සූදානම් කරන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා. අපේ සහබන්දු මන්ත්‍රීතුමා ගොඩක් දේවල් කතා කලා. ඒවට උත්තර දෙන වෙලාවකුත් නෙවෙයි. ගම්මැද්දේගොඩ උඩවැලිවිටිය ප්‍රධාන මාගර්ය රැකඩහේනට වැටෙන මාගර්යේ දැන් ගල් ගැලවිලා. නෙරංජලී මන්ත්‍රීතුමිය සඳහන් කළා. අපි මැදිහත් වෙලා පළාත් සභාවට දැනුම් දීලා මොකක් හරි කරමු කියලා යෝජනා කරනවා. අවසාන වශයෙන් අපේ මාගර් සංවධර්නය කරන්න වැඩපිළිවෙළක් සකස් කරමු කියන යෝජනාව කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා .බොහොම ස්තුතියි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී කේ.ඒ.සී දිල්රුක්ෂි මහත්මිය**

සභාපතිතුමාගෙන් ද ලේකම්තුමියගෙන්ද, සමස්ත මන්ත්‍රි මණ්ඩලයෙන්ද අවසරයි. මම යෝජනාවක් කරනවා. සභාව සතු දේපල අහිමි වීම සම්බන්ධයෙන් හැමදාම කතා කරනව. ඒකට විසඳුමක් වශයෙන් සභාවතුල,සභාව සතු දේපොළ තියන ප්‍රධාන ආයතනවල සීසීටීවී කැමරා පද්ධතියක් සවි කරන්න කියලා. ස්තුතියි.

**ගරු උප සභාපති තුමා අදහස් දක්වමින්**

සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි වෙනත් කරුණු යටතේ මුලින්ම මම ස්තූති කරන්න ඕන. පසුගිය පළාත් පාලන පුහුණුවට යොමු කරපු ගරු ප්‍රධාන අමාත්‍ය තුමාටත්, පළාත් පාලන කොමසාරිස් තුමාටත්, සහකාර කොමසාරිස් තුමිය ඇතුළු ඒ කටයුතු සංවිධානය කළ පළාත් පාලන ආයතන ප්‍රධානීන් සියලු දෙනාට අපේ ප්‍රසාදය මේ අවස්ථාවේදී පළ කරනවා. එහි යම් යම් අඩුපාඩු කම් හා අපහසුතාවයන් තිබුනත් නවක මන්ත්‍රීවරු වශයෙන් හා හිටපු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ටත් යම් යම් අත්දැකීම් හා ඒවා බෙදා හදා ගන්න, දැනුවත් වීම සඳහා පාඨමාලාව සකස් කිරීම පිළිබඳව සභාවේ සියලු දෙනාගේ තීරණයක් අනුව අදාළ අංශවලට ප්‍රසාදය පළ කර ලිපියක් යවන ලෙස යෝජනා කරනවා. ඒ වගේම අපේ සහබන්දු මන්ත්‍රීතුමා එම පුහුණු වැඩසටහනට සම්බන්ධ කරගැනීමට නොහැකි වීම පිළිබඳ කනගාටු වෙනවා. එතුමා ඒ සම්මේලනයට ගියානම් අද මේ සභාවේ කටයුතු කිරීමෙදි විශාල වෙනසක් බලාපොරොත්තු වෙන්න තිබුණා. අද මේ සභා රැස්වීම, මේ කාලය තුළ අපි මෙතනදි කටයුතු කරපු ආකාරය පිළිබඳව අධීක්‍ෂණය කළොත් මෙය විධිමත් සභාවකද, අවිධිමත් සභාවක ද හිටියෙ කියලා අපට අවබෝධ වනු ඇතැයි,ගරු නවක මන්ත්‍රීවරුන්ට පැහැදිලි වනු ඇතැයි මම බලාපොරොත්තු වෙනවා. අපි යම් යම් කාරණා පිළිබඳව විශේෂයෙන් ම වෙනත් කරුණු යටතේ රටේ දේශපාලන තත්ත්වය ,පළාතේ දේශපාලන තත්ත්වය, ලෝකයේ දේශපාලන තත්වය පිළිබඳව කතා කරනවා. එහෙමත් තියෙන්න ඕන. නැත්නම් විනෝදයක් නැහැ. ඒ අතින් සහබන්දු මහත්තයා අගය කරනවා. වසන්ත මහත්මයාත් හිටපු ගමන් එහෙමයි. සහබන්දු මහත්තයා යම් කාරණයක් ප්‍රදේශයට,රටට,ලෝකෙට ගලපගෙන කියනව.විධිමත් සභාවක ඒව නැහැ. සභාවට අයිති දේවල් පමණක් කතා කරන්න අවකාශ තියෙනවා .ඔබතුමාල කවුරුත් ඒක දන්නව. ඒවගේම සභාවෙන් බැහැරව යම්කිසි කරුණු කාරණා ඉදිරිපත් කරනවා නම් ඒ කතාව නතර කරන්න, පළමුවර,දෙවනවර ලෙස අවවාද කරන්න,නැත්නම් සභාවෙන් එළියට දාන්නත් ගරු සභාපතිතුමාට බලය තියෙනවා. ගරු මන්ත්‍රීවරු කතාකරන කොට මූලාසනයටකතා කරන්න කියල. අපේ නීති රීති වල තියෙනව. මූලාසනයටකතා නොකරනවානම් එහිදිත් සභාපතිවරයාට අවසරය තියෙනවා අවවාද කරන්න. ඉතිං මේ සභාවෙ ඒ අඩුපාඩු පිළිඉඳව කටයුතු කරන්න ඕන.නමුත් න්‍යාය පත්‍රානුකූලව නීති රීති,සභා රීති අනුව කටයුතු කිරීමේදී ඇල්මැරුණු ස්වභාවයක් ගන්නව . නමුත් අපි කතා කළ යුතු කරුණු කාරනා තියෙනව සහබන්දු මහත්මය ඉදිරිපත් කළ කරුණුවලට.අපේ රැස්වීම පිළිබඳව මම කතා කරන්නෙ නැහැ.  මොකද මමත් ඒ ගොඩට වැටෙන නිසා . ඒ වගේම මම සහබන්දු මන්ත්‍රීතුමාට උත්තර දෙන්න යන්නේ නැහැ. නමුත් අවසාන වශයෙන් සභාවාරයට ගැලපෙන ලෙස කටයුතු කරන්න කියලා මතක් කරනවා. ගරු මන්ත්‍රීතුමනි මේ සභාව අද දින ආරම්භයේ සිටම යම් යම් විවිධ කාරණා පිළිබඳව වැදගත් තීරණ ගත්තා. ඉදිරියට ඒවා ක්‍රියාවට නංවමු. මේ සභාවාරය  විධිමත් ආකාරයෙන් පවත්වාගෙන යාමට. ගරු සභාපතිතුමාට ශක්තිය ධෛර්ය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ගරු සභාපතිතුමනි, නියෝජ්‍ය සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීවරුනි, ගරු මන්ත්‍රී එන්.වී.සමන් මහතාට පිළිතුරු දෙමින්, අපි ජේෂ්ඨයො නෙවෙයි. අපිත් ඔබ වගේම මන්ත්‍රීවරයෙක්. මීට කලින් සභාවට ඇවිල්ල තියනවා. නමුත් ඔබතුමා කිව්වා අපි මේක අවුල් කරනවා කියලා. අපිට කොහෙත්ම මෙතුමට අවුල් කරන්න උවමනාවක් නැහැ. හැබැයි වැරැද්දක් වුනාම ඒක කියන්න තමයි ජනතාව අපි මෙතනට පත්කරල එවලා තියෙන්නේ.  ඒ නිසා ඔබ සභාපතිතුමාට පක්ෂපාති වුනාට අපි පක්ෂපාතී නැහැ. පක්ෂපාතී වෙන්න පුලුවන් දේවල් වලට අපි කතා කරලා සහයෝගය ලබාදෙනවා. විරුද්ධව මතයක් ප්‍රකාශ කිරීමේ අයිතිය අපට තියෙනවා. ඒ අයිතිය ඔබටත් තියෙනවා. ඔබ එක තේරුම් ගන්න කියන එක බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

අපි ගැටුමකට නො ගිහිල්ලා ඔබේ මතයට මම ගරු කරනවා. ඒ වගේම අපේ මතයටත් ගරු කරන්න ඉවසන්න පුරුදු වෙන්න කියන පුංචි ඉල්ලීමත් කරනවා. මේ සෑම මන්ත්‍රීවරයෙකුගේම වරප්‍රසාද අයිතිය වෙනුවෙන් කතා කරන්න ඕන. ඒ අයිතිය ඔබට ,මට වගේ හැමෝටම තියෙන්න ඕන. නැත්නම් සභාපතිතුමා විතරක් තනියෙන් වැඩකර ගන්නවා.  සභාපතිතුමා පොඩ්ඩක් හරි වැඩකරන්නෙ අපි නිසා. ලක්ෂ හැට අටක් තියාගෙන මොනවත් නොකරන එක ගැන මම කනගාටු වෙනවා. ඉතිහාසයේ මේ වගේ සභාපතිවරයෙක් ඉඳලා නැහැ. ඒ වගේම

මම කනගාටු වෙනවා. අපේ විජිත් සහබන්දු මන්ත්‍රීතුමා යටලමත්ත වෙනුවෙන් කිසිම යෝජනාවක් සඳහන් කරලා නැහැ. මම දාන්නේ නැති එකේ එතුමගේ යෝජනා ටික දාන්න.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපට මෙතෙන්ට ආවම වාඩිවෙන්න තැනක් හදලා දෙන්න. අපි එන්නේ නැහැ. පැහැදිලිවම අපි මෙතනට එන්නෙ නැත්තෙ ආත්ම ගරුත්වයක් තියාගෙන මෙතන මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරන්න අවකාශ නැති නිසා. මම නාවත් මේ ඉන්න අනිත් මන්ත්‍රීවරු ප්‍රාදේශීය ලේකම් කායර්‍යාට යන ගමන් තවත් කෙනෙකුට ලියුමක් දෙන්න,නැත්නම් කවුරු හරි හමුවෙන්න මෙතනට ආවොත් ඒ අයට ඉඳ ගන්න තැනක් නැහැ. එක්කො උප සභාපති තුමාගේ කාමරයට යනවා. එතුමා හිටියොත් එතන බැහැ. ඒ හින්ද මේක මෙතුමගෙන් ඉල්ලුව, විලේගේ සභාපතිතුමාගෙන් ඉල්ලුවා. කවුරුවත් කළේ නැහැ. ඔබතුමාවත්, ඔබතුමා මේ පැත්තෙ හුඟක් කල් වාඩිවෙලා හිටිය නිසා කල්පනා කරලා අඩුම තරමේ පුටු දෙකක් තුනක් දාන්න පුලුවන් වෙන්න ස්ථානයක් සකස් කරලා දෙන්න කියල ඉල්ලා සිටිනවා.

අපේ විපක්ෂ නායකතුමා සහබන්දු මන්ත්‍රීතුමා පිට්ටනියෙ දාපු ගල් ප්‍රමාණය ගැන කතා කළා. අපි දන්නවා, අපිත් එක්ක බොහෝම හිතවත් කෙනෙක් දාල තියෙන්නෙ. නමුත් ඒක නොවිය යුත්තක්. ඒ මහත්මයත් එක්ක කිසිම අමනාපයක් නැහැ. නමුත් එතන තියන ප්‍රශ්නෙ තව කෙනෙක් ඇවිල්ලා ඉල්ලුවොත් මොනවා හරි දාන්න. දෙන්න වෙනවා. අපි කියනව දෙන්න කියල.හෙට ඇවිත් දයානි එකේ මහත්මය වාහන ටික දාන්න ඉල්ලුවොත් අපට දෙන්න වෙනවා. ඒ නිසා මේ ක්‍රමවේදෙ වැරදියි. නොවිය යුත්තක් ඒ නිසා ඒ කෙරෙහි අවධානය යොමු කරන්න කියලා ගරු සභාපතිතුමා ගෙන් මම ඉල්ලා සිටිනවා. ඒ වගේම අපේ සභාවට අයත් සුසාන භූමියක් දෙකක් තියෙනවද කියල මම දන්නේ නැහැ. තියනවනම් මේ වෙලාවෙ අත්‍යවශ්‍යයි. මොකද යටලමත්තෙ පහුගිය දවස්වල ප්‍රශ්නයක් වුනා.අපට මතක් වෙන්නෙත් මේ වගේ අවස්තාවලදි නිසා කොහේ හරි සුසාන භූමියක් තියෙනවනම් ඒ කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරන්න. පහු ගිය දිනවල ඔබට අපට කියල දුන්න.ඇතැම් මරණ භූම දානය කරන්න විතරයි දෙන්නෙ.ආදාහනය කරන්න දෙන්නෙ නැහැ.අපේ ගමේ මට සිදුවුනු ප්‍රශ්නයක් නිසා කියන්නෙ කොහේ හරි සුසාන භූමියක් තියෙනවනම් ඔබතුමාගේ අවධානය යොමුල අයිතිය පවර ගන්න කටයුතු කරන්න කියල මම පොඩි ඉල්ලීමක් කරනව.

#### ගරු සභාපති තුමාගේ මූලාසන කතාව

ගරු නියෝජ්‍ය සභාපතිතුමා මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමින්ලා ඇතුළු සියලු දෙනාගෙන්ම අවසරයි. අද දින උඩුගම මහා විද්‍යාලයේ පැවති ප්‍රාදේශීය සාහිත්‍ය කලා උත්සවයට සහභාගිවීමට නියමිතව තිබුණු නිසා. නියමිත වේලාවට සභාවට පැමිණීමට නොහැකි බැවින් ගරු නියෝජ්‍ය සභාපති ගාමිණී සුසන්ත මහතාට අද සභාව මෙහෙයවන ලෙස කරන ලද ආරාධනය පිළිගෙන එම කටයුත්ත නිසි අයුරින් සිදු කළ ගරු නියෝජ්‍ය සභාපති තුමාට හා ලේකම්තුමියට සභාපතිතුමා විසින් ස්තූතිය පුදකරන ලදී.

පළමුවෙන්ම ජල ප්‍රශ්නය පිළිබඳව අදහස් දැක්වූ ගරු සභාපතිතුමා කියා සිටියේ පැයුවෙ සතියක පමණ කාලයක් වුවත් මේ වන විට තමාගේ නාගොඩ ගෙදරටත් ජලය නොමැති බවයි. ජල ප්‍රශ්නය උග්‍ර අතට හැරී ඇති බවත් උඩුගම රෝහලේ වෛද්‍ය නිලධාරී තුමිය විසින් අද දින සායන දිනයක් බැවින් රෝහලේ ළිඳේ වතුර නැති නිසා ඔවුන්ට කරන්න උදව්වක් වශයෙන් වතුර බවුසරය ලබාදෙන ලෙස ඉල්ලීම් කරන ලද බවත් ප්‍රකාශ කළේය. ජලය ලබා දීම සම්බන්ධව සොයා බැලීමේදී එක් වතුර බවුසරයක් මගුල් ගෙදරකට ගෙන ගොස් ඇති අතර අනික් බවුසරය සභාවේ ජල අවශ්‍යතා සපුරා ගැනීම සඳහා යොදවා ඇති බව දැන ගැනීමට හැක්වූ බව පැවසීය. බද්දේගමින් හෝ වතුර ගෙනවිත් ඒ අවශ්‍යතාවය සම්පූර්ණ කළ යුතු බව පැවසූ අතර ඉදිරියේ දී මුදල් වියදම් වුවත් බද්දේගමින් හෝ වතුර බවුසර් පුරවා ගෙන විත් ප්‍රධාන පාරවල්වල ජලය හිඟ අයට ජලය බෙදාහැරීමේ වැඩපිළිවෙලක් සකස් කරන බව අවධාරණය කළේය. බවුසර් 4ක් තිබෙන බවත් ඉන් දෙකක් හදිසි අවශ්‍යතාවන් හා වෙනත් කටයුතු සඳහා පුරවා ඇති බව පවසන ලදී. පසුගිය දිනක කන්නෙලිය සිදුවූ හදිසි ගිනිගැනීම් තත්ත්වයේදී ලබාදීමට වතුර බවුසර් නොතිබූ බවත් බවුසර් දෙකම වෙනත් අවශ්‍යතා සඳහා යොදවා තිබූ බව දන්වන ලද අතර මේ වන විට වතුර පිරවීමට තැනක් නොමැති බවද ප්‍රකාශ කරන ලදී. තව මාස 12 කින් මේ ලක්ෂ 68 වියදම් වෙන්න හැකියාව ඇති බවත් ජූලි මස ආදායම 585550 වන අතර වියදම 1092450

වන බවත් ලක්ෂ 5ක විතර ණය ප්‍රමාණයක් ඇති බවත් පැහැදිලි කරන ලදී. තව අවුරුද්දක් යනවිට මේ සල්ලි ටික වියදම් කළ හැකි බවත් ඉන්පසු මන්ත්‍රීවරුන්ගේ ඉන්ධන වියදමවත් ලබාදීමට නොහැකි වන බව ද ඉදිරියට LRC එකේ ඉඩම් ලබාදීමට කටයුතු කළහොත් ඒ ඉඩම් ලබාගැනීමේදී අපි විසින් මුදල් ප්‍රමාණයක් ගෙවිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ඒ වගේම තල්ගස්වල ආදාහනාගාරයට වෙන් කරන ලද ඉඩම හා ඊට එහා පැත්තෙ ඉඩමෙ මාපලගම රණවිරු ගම්මානයේ ඔබතුමාලගේ කට්ටිය ඊයේ ඇල්ලුවා නමුත් එය නැවැත්වීමට ක්‍රියා කළ බව පැවසූ අතර සුසාන භූමියට වෙන් කරන ලද අක්කර තුන හමාරක ඉඩම මනින්න ගිය බවත් එම ඉඩම පවරා දීමට LRC එකෙන් කටයුතු කරන අතර තවත් ඉඩමක් වලකුඹුර ප්‍රදේශයෙන් ඉල්ලා ඇති බවත් පැවසීය. තල්ගස්වල ඉඩම වත්තෙන් නිදහස් කර ඇති බව හා  පසුගිය කාලයේ වන වගාවක් කරන ලද බවත් දැන් බණ්ඩාර කියන පුද්ගලයා විසින් එහි තේ වගා කර ඇති බව ප්‍රකාශ කළේය. මේ ඉඩම් වලට ගෙවීම සඳහා සහ ඉදිරියේදී වෙනත් කටයුතු සඳහා මේ මුදල් ආරක්ෂාකාරීව තබාගෙන ඇති බව අවධාරණය කරන ලදී.

වීථි පහන් සම්බන්ධව සභාපතිතුමා අදහස් දක්වමින්, මන්ත්‍රීවරුන් කොපමණ කෑගැසුවත් විදුලි බල්බ් එකක්වත් දාන්න නොවෙන බවත් අපට ආදායම් දඩ මුදල් නැති නිසා ඉදිරිය බලාගෙන පරිහරණය කළ යුතු බවයි නමුත් අපි බලාපොරොත්තු වන සංවධර්නය සිදු කරන බව ප්‍රකාශ කරන ලදී.

ඉන්පසු කුණු ප්‍රශ්නය ගැන කතා කළ සභාපතිතුමා ඔහුට දුරකතනයෙන් කතා කොට වනිගරත්න මන්ත්‍රීතුමාගේ ගම් ප්‍රදේශයට කුණු ටැක්ටරය ඉල්ලූ බවත් එසේම ඌරලටත් ඉල්ලූ බැවින් ඒකට ක්‍රමවේදයක් සකස් කරගෙන යන බවත් පාවිච්චි කළ හැකි මට්ටමේ පවතින්නේ එක ටේලරයක් පමණක් වන නිසා මාසෙකට එක දවසක් ගොස් කුණු ගැනීමේ තේරුමක් නොමැති බවත් කියා සිටියේය.කුණු ගැනීම සිදුකරනු ලබන්නේ යුතුකමක් හා වගකීමක් හැටියටත් කුනු නොගැනීම නිසා දෝෂාරෝපණය කළ නොහැකි බවත් පෙන්වා දෙන ලදී. එමෙන්ම විදුලි බල්බ ගැනීම සඳහා සහ කසල බද්ද පැනවීම සඳහා වැඩපිළිවෙළක් සකස් කරන අතර එසේ ආදායම් උත්පාදනය කර ගනිමින් කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදී. මෙම මුදල් අර පිරිමහගෙන කටයුතු නොකළොත් පසුව ඔබතුමන්ලාට පාඩු විදින්න සිදු සිදුවන බවට ද අවධාරණය කරන ලදී. ක්‍රීඩා තරගය ගැන කතා කළ ගරු සභාපතිතුමා, අපි කවුරුත් ක්‍රීඩා වලට කැමති බව හා එමගින්  සුහදත්වය වධර්නය වන බවත් දකුණු පළාතේ නිලධාරීන් මන්ත්‍රීවරුන් එකතුවෙලා කරන නිසා සහභාගි විය යුතු බවයි. ප්‍රශ්නයකට තියෙන්නේ රුපියල් 60,000 මුදල දරාගැනීමේ අසීරුතාවය බව පෙන්වා දෙන ලදී. අපි සභාපතිවරුන් සමග සාකච්ඡා කළේ ක්‍රීඩාවට නොයන්න නෙවෙයි මේ 60000 මුදල වලක්වා ගැනීමට හැකියාවක් ඇත්ද යන්න සොයා බැලීම සඳහා බවද ප්‍රකාශ කරන ලදී.

කම්කරුවන් සම්බන්ධව අදහස් දැක්වූ ගරු සභාපතිතුමා කියා සිටියේ එක් මන්ත්‍රී කෙනෙකු උඩුගම පොලට කැඳවත් දී තවත් මන්ත්‍රීවරයකු පාරක් සඳහා කම්කරුවන් ඉල්ලා සිටින බවත් සභාවෙ ඉන්න කම්කරුවන් හයදෙනාගෙන් මේ සියලුම කායර්යන් කරවා ගැනීම අපහසු කටයුත්තක් බවයි. ඒ නිසා මන්ත්‍රීවරුන්ට තන්ගේ බල ප්‍රදේශයේ ශ්‍රමදාන මගින් කටයුතු කරන ලෙස දන්වන ලදී. එයට හේතුව ලෙස අද එක් ස්ථානයක වැඩ කර එය අවසන් නොකර හෙට වෙනත් ස්ථානයකට යාමට නොහැකි බව පෙන්වා දුනි.

යම් පුද්ගලයෙක් ගල් වගයක් දාගන්න තැනක් නොමැති නිසා පිට්ටනියට දාන්න අවසර ඉල්ලූ විට ඉක්මනට ඉවත්කරගැනීමේ කොන්දේසිය මත පිට්ටනියට දැමීමට අවසර ලබාදුන් බවත් ඒසේම ඉක්මනට ඉවත් කරගන්නා ලෙස පවසමින් පොල් මුල් දැමීමටද අවසර දුන් බව ද ඒ සියල්ල කළේ තමා ගෙන් අවසර ඇතිව බව ගරු සභාපතිතුමා පවසන ලදී.

තල්ගස්වල මාපලගම අතර ෂෙඩ් එක ලඟ තට්ටු දෙකට කඩයක් සකස් කරන බවත් එයට පැමිණිල්ලක් ලද බවත් ඒ අනුව පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කළ බවද පනත අනුව ක්‍රියා කරන්න වෙන බව පවසා නිදහසට කරුණු ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ලිපියක් යැවූ බවත් සභාපති හැටියට තමාට බැකෝ එකක් අරන් ගිහින් එය ඉවත් කිරීමට හැකියාවක් ඇති බවද ප්‍රකාශ කරන ලදී. එබැවින් ඉදිරියේ දී යම් ඉදිකිරීමක් කරනවානම් සභාව දැනුවත් කරන හැටියට මුළු බලප්‍රදේශය පුරා ප්‍රචාරාත්මක වැඩසටහනක් ක්‍රියාමක කිරීමට අදහස් කරන බවද ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ මාපලගම වැසිකිලිය සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු සභාපතිතුමා එහි ප්‍රශ්නයක් ඇති බවත් සුනිල් සේනානායක මැතිතුමා එතුමන්ලාගේ බලතලත් අරගෙන කටයුතු කරන ලෙස දැන්වුවද එම පාශර්වයේම මැති ඇමතිවරු දෙදෙනෙක් අනිත් පාශර්වයට එතන එපා යනුවෙන් බලපෑම් කරන ලද බවත් වෙළෙඳ සංකීණර්යේ ඇති වැසිකිළිය නවීකරණය කර සකස් කර දීමට මාගර්ස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ අධ්‍යක්ෂතුමා ගරු සභාපතිතුමාගෙන් විමසූ බවත් ඒ සඳහා අවසර ඉල්ලූ බවත් ප්‍රකාශ කරන ලදී. එන 18 වෙනිදා ප්‍රාදේශීය ලේකම් තුමියගේ මූලිකත්වයෙන් පත් කරන ලද කමිටුවක් මගින් ස්ථානීය පරීක්‍ෂණයක් සිදු කිරීමට නියමිත බැවින් 18 වෙනිදාට මේ සම්බන්ධව විරෝධය දැක්වීම සඳහා පැමිණෙන ලෙස මන්ත්‍රීවරුන්ට දන්වන ලදී.

මහජන සෞඛ්‍ය පරීක්‍ෂක වරු පිළිබඳවද කතා කළ ගරු සභාපතිතුමා කියා සිටියේ ඒ සම්බන්ධව දැනුවත් නොමැති බවත් වෙනත් ස්ථාන තිබේ නම් එතුමන්ලා දැනුවත් කරන්න.එවිට එතුමන්ලාගේ ක්‍රියාකාරීත්වය අපට බැලිය හැකියි යනුවෙනි. නමුත් දැනට එහෙම පෙනුමක් නැති බවත් ඊයෙ දිනයෙදි ඩෙංගු නැති හොඳම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ලෙස සඳහන් ලිපියක් ලද බවත් එහි ක්‍රෙඩිට් එක මහජන සෞඛ්‍ය පරීක්‍ෂක මහතුන්ට ද යන බවත් ප්‍රකාශ කළ අතර ජලභීතිකා නිවාරණ කටයුතු මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගෙන් පශු වෛද්‍ය එකට අරගෙන වැඩසටහනක් සිදුකළ බවද දන්වන ලදී

වෙරංග මන්ත්‍රීතුමා උපකායර්ාලයේ රංගන ශාලාව සම්බන්ධව යොමු කල කරුණු කෙරෙහි අවධානය යොමු කළ ගරු සභාපතිතුමා කියා සිටියේ කෝටි ගානක් වියදම් කළද නියම ප්‍රමිතියකට එය සිදුකර නොමැති බවයි. ජලය විදුලිය පහසුකම් ලබා දෙන්නේ වතර්මානයේ මේ සභාවෙන් බව පෙන්වාදුන් සභාපතිතුමා ජලය වෙනුවෙන් රුපියල් විසිපන්දාහක මුදලක් බැඳ ඇති නමුත් ජලය සපයා නොමැති බවත් ඉදිරියේදී නාට්‍ය පෙන්නන්න හෝ වෙනත් කටයුත්තක දී තිර රෙදි ටික දැමිය යුතු බවත් එම කායර්යන් කිරීමේ දී මිලගණන් කැඳවා කටයුතු කළ යුතු බව ද දන්වන ලදී.

මේ සභාවෙන් වැඩ කෙරෙන්නෙ නැහැ කියන ප්‍රකාශයන් ප්‍රතික්ෂේප කරමින් ගරු සභාපතිතුමා කියා සිටියේ ඔබතුමාලා දීපු යෝජනා අනුමත වී ඇති බවත් පොදු අරමුදල් මගින් ඒවා කලයුතු බවත්ය. යටලමත්තෙ එක යෝජනාවක වැඩ අවසන් කර ඇති බවත් ප්‍රකාශ කළේය. ඔබතුමාලගේ ආණ්ඩුවෙන් මොනවද කරල තියෙන්නේ. අඩුම ගණනේ අපි මේ සභාවෙන් බල්බ් එක හරි දානවා. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු අනෙක් මන්ත්‍රීවරු එක බල්බ් එකක් හෝ දාල තියෙනවද පාරකට ගල් කොරි පස් ටිකක් දාගත්තද යනුවෙන් විමසන ලදී.

එමෙන්ම ගරු සභාපතිතුමා කියා සිටියේ අපේ සභාව ගෞරවනීය බවත් කොපමණ වාද විවාද සිදු වුවත් සුහදත්වයෙන් යුතුව සහෝදර ලීලාවෙන් යුතුව සභාවෙන් පිටවන අතර ඒ ගැන සතුටු වන බවය. නමුත් වැඩ කිරීමේදී යම් අපහසුතාවයන්ට ලක් වන බවයි. ඔබතුමන්ලා ඉල්ලූ ඉල්ලීම් ඉටු කරගන්න අපහසු වෙනවා නම් මා ගැන අනුකම්පා කරන ලෙසත් සියලු දෙනාගේ ඉල්ලීම්වලට ඇහුම්කම් දිය යුතු බවත් පවසන ලදී.

එමෙන්ම ලබන සභා වාරයට පෙර මේ ශාලාව වායු සමනය කරන බවත් එහෙම නොවුනොත් සභාපතිකමෙන් ඉවත්වන බව ප්‍රකාශ කළේය. ඒ අය ආවේ නැති නිසා සිදු කරගත නොහැකි වූ බවත් වෙනත් කරදරයක් නො වුණොත් ඒ දේ කරනවා යැයි දැඩි විශ්වාසයෙන් ප්‍රකාශ කළ අතර එමෙන්ම ආථරීක අපහසුකම් පවතින බවත් නැත්නම් එතුමන්ගේ ද කැමැත්ත ඇති බවද ප්‍රකාශ කළේය.

නිශාන්ත නන්දන මන්ත්‍රීතුමාගේ යෝජනාවට පිළිතුරු දුන් ගරු සභාපතිතුමා මන්ත්‍රීවරුන්ට රැඳී සිටින්න තැනක් හදන්න කියන යෝජනාව සම්මත වී පැමිණි නමුත් එය හදන්න අනුමැති ලැබී නොමැති බවත් එසේ නොවුනේනම් මේ වන විට වැඩ අවසන් බවත් පැවසූ අතර මේ සඳහා අවශ්‍ය කටයුතු ඉක්මනින් සලසා ලන්නා ලෙස ලේකම්තුමියට දැනුම් දෙන ලදී.

එමෙන්ම 18 19 20 දඹුල්ල ඊඩන් ගාඩන් හෝටලයේ පැවති පුහුණු සැසිය පිළිබඳ අදහස් දක්වමින් කියා සිටියේ සහබන්දු මන්ත්‍රීතුමාට විවාහ මංගල උත්සවයක් නිසා සහභාගී වීමට නොහැකි වූ බවත් එතුමාටත් සහභාගි වෙන්න හැකියාවක් තිබුණ නම් සතුට පත්වන බවත් ඒ පුහුණුවේදී කණ්ඩායම් හැඟීම අපේකම රැකගෙන

කටයුතු කිරීම පිළිබඳවත් සතුටට පත්වන බව ප්‍රකාශ කරන ලදී. ඒ පිළිබඳව මහ ඇමති තුමාට හා නිලධාරී මණ්ඩලයට ස්තුතිය පුද පුද කරන බව කියා සිටියේය.

ගරු සභාපති තුමන් නැවත වරක් අදහස් ප්‍රකාශ කරමින් 2002 දී ප්‍රාදේශීය සභාවට පැමිණි බවත් එදා ඉඳලා අද වෙනකම් මහා සභාව කාරක සභාවක් බවට පත්වුණේ අද පමණක් බවත් එය සාර්ථක වූ බවත් සහබන්ධු මන්ත්‍රීතුමා සහභාගි නොවුණත් එතුමාගේ ගැටළුවට පිළිතුරු ලැබෙන්න ඇති කියලා විශ්වාස කරන බවත් අතීතයෙදි යම් යම් අඩුපාඩු තිබෙන්නට ඇති බවත් කීය. යථා කාලයේදී පරීක්ෂණයක් සිදුකරන බවත් JCB යන්ත්‍රය මෙසේ තවත් කාලයක් තියෙද්දි මිල අඩුවන නිසා මේ අවස්ථාවේ යම් ක්‍රමවේදයකට අනුව අදාල කටයුත්ත සිදු කළ හැකි නම් ඒ ඉතා යෝග්‍ය බව ප්‍රකාශ කරන ලදී සියලුදෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                    දිනය :- ..............................